*සැ. යු.*- 2021.02.05 දින අංක 2214 දරන *ගැසට් පත්‍රයේ* III කොටස පළ නොවිය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,215 - 2021 පෙබරවාරි මස 12 වැනි සිකුරාදා - 2021.02.12**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : (IIඅ) වැනි ඡේදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)

| | පිටුව |
|---|---|
| තනතුරු ඇබෑර්තු .... ... ... | 270 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 287 |

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

**වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ගැසට් පත්‍රය පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

ගැසට් පත්‍රයේ පළ කරන සෑම දැන්වීමක් ම ගැසට් පත්‍රය පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2021 මාර්තු මස 05 වැනි දින පළ කරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2021 පෙබරවාරි මස 19 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2021 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම ගැසට් පත්‍රය *www. documents.gov.lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

267 B 82203 — 5,403 (2021/02)
B 1 -

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන රාජ්‍ය සේවා පත් කිරීම්වලට අදාළ වන පොදු කොන්දේසි

**අවශ්‍ය සාමාන්‍ය සුදුසුකම් :**

1.1 තමා ශ්‍රී ලාංකිකයෙකු බවට ප්‍රමාණවත් සාක්ෂි සෑම අයදුම්කරුවකු විසින් ම ඉදිරිපත් කළ යුතුය.

ශ්‍රී ලාංකික යනුවෙන් අදහස් කෙරෙනුයේ ලංකා පුරවැසි පනතේ අර්ථ දක්වා ඇති පරිදි පාරම්පරික වශයෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසිකම් ලැබූවෙකි.

1.2 ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් සමත් වී තිබීම අවම අධ්‍යාපනික සුදුසුකමක් වශයෙන් නියම කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු සිංහල හෝ දෙමළ හෝ මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ අයෙකු වේ නම්, ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ සිංහල හෝ දෙමළ හෝ භාෂාව විෂයයෙන් අවස්ථාවෝචිත පරිදි සමත් වී සිටිය යුතු ය. (1961 ජනවාරි මස 01 වැනි දිනට පෙර දිනක සිට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින්නාවූත් රාජ්‍ය සේවයෙහි වෙනත් තනතුරුවලට ඉල්ලුම් කරන්නාවූත් නිලධාරීන් විෂයයෙහි මෙම නියමය අදාළ නොවන්නේ ය.)

*1.3 අයදුම් කරනු ලබන තනතුර සඳහා නියමිත ඉහළම රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණවලින් නිදහස් කිරීමට හිමිකම් ලබන සුදුසුකම් පසු කලක දී ලබා තිබේ නම් මිස, නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණය සමත්වීමට අපොහොසත්වීම නිසා පරිවාස/පරීක්ෂණ කාලයකට යටත්ව දෙන ලද සිය පත්වීම අවසන් කරනු ලැබූ, සිංහල හෝ දෙමළ හෝ නොවන භාෂා මාධ්‍යයකින් රජයේ සේවයට ඇතුළත්ව සිටි නව ප්‍රවේශක නිලධාරීන්ගෙන් ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

**2. සේවා කොන්දේසි - සාමාන්‍ය :**

2.1 රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සියලු ම නිලධාරීහු මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය, දෙපාර්තමේන්තු නියෝග හෝ රෙගුලාසි සහ රජය විසින් වරින් වර නිකුත් කරනු ලැබිය හැකි වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට යටත් විය යුත්තා හ.

2.2 අදාළ අමාත්‍යාංශයෙහි ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයේ මුදලක් එම ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි අන්දමකින් ඇප තබන ලද රාජ්‍ය සේවා නිලධාරීන්ගේ (ඇප) ආඥාපනත යටතේ රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැකි ය.

2.3 දිවයිනේ ඕනෑ ම තැනක සේවය කිරීමට රාජ්‍ය නිලධාරියෙකුට නියම කරනු ලැබිය හැකිය.

**3. ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීන්ට අදාළ සේවා කොන්දේසි**

3.1 ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරිහු පූර්වෝක්ත 2 වැනි වගන්තියේ සඳහන් කොන්දේසිවලට අතිරේක වශයෙන් පහත දැක්වෙන අනිකුත් කොන්දේසිවලට ද යටත් විය යුතුය.

3.1.1 යම්කිසි තනතුරක පරිවාස කාලය අවුරුදු තුනකට වැඩි විය යුතු යැයි සලකනු ලබන්නේ නම් විනා එසේ නොමැති නම් සියලු ම පත් කිරීම් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වනු ඇත. පරිවාස කාලය තුළ හේතුවක් නොදක්වා සේවය නතර කරනු ලැබිය හැකිය.

3.1.2 සියලු ම රාජ්‍ය නිලධාරීහු රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියෙහි අවශ්‍යතාවයන් සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IV වන පරිච්ඡේදයේ විධිවිධාන සහ රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පවත්නා වූ සහ මින් මතු පනවනු ලබන්නාවූ අනෙකුත් නීති, රෙගුලාසි සහ ව්‍යවස්ථා ද පිළිපැදිය යුත්තාහ.

3.1.3 රාජ්‍ය භාෂාවකින් වැඩ කිරීමට හැකිවන අන්දමේ දැනුමක් තමන්ගේ පරිවාස කාලය ඇතුළත ලබාගන්නා ලෙස සිංහල හෝ දෙමළ නොවන භාෂා මාධ්‍යයකින් රාජ්‍ය සේවයට ඇතුළත් වූ නිලධාරීන්ට නියම කෙරේ.

3.1.4 සිංහල හෝ දෙමළ හෝ නොවන වෙනත් භාෂා මාධ්‍යයකින් සේවයට ඇතුළත් වූ නිලධාරියෙකු පරිවාස කාලය අවසානයේ දී තනතුරෙහි ස්ථිර කරනු ලැබීමට අදාළ වන වෙනත් කරුණු අතර, අවුරුද්දක් ඇතුළත කවර හෝ රාජ්‍ය භාෂාවකින් නියමිත ප්‍රවීණතා පරීක්ෂණයෙහි I වැනි ශ්‍රේණියෙන් සමත්වීමත්, අවුරුදු දෙකක් ඇතුළත II වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් (අවශ්‍යනම්) අවුරුදු තුනක් ඇතුළත III වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් බලපවත්වනු ඇත.

නියමිත කාල සීමා ඇතුළත දී පරීක්ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වර්ධකයක් තාවකාලිකව අත්හිටුවනු ලැබිය හැකි ය. නියමිත කාලසීමාව ඉක්මවා තව මාස හයක කාලසීමාවක් ඇතුළත යථෝක්ත පරීක්ෂණයෙන් සමත්වීමට අසමත් වුවහොත් එසේ වැටුප් වර්ධක තාවකාලිකව අත්හිටුවීම, වැටුප් වර්ධක නතර කිරීමකට පරිවර්තනය කෙරෙනු ඇත. පරීක්ෂණයෙන් සමත්වන තෙක් හෝ පහත දැක්වෙන 3.1.6 වැනි වගන්තියේ විධිවිධානයන් බලපවත්වන තෙක් හෝ යථෝක්ත වැටුප් වර්ධකයන් නතර කිරීම ක්‍රියාත්මක වන්නේය.

3.1.5 මෙවැනි නිලධාරීන්ට පත්වීම ලැබීමෙන් පසු රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාවය ලබා ගැනීම පිණිස මාස හයක කාලයක් සඳහා පූර්ණ වැටුප් සහිත පහසුකම් සැලසිය යුතුය. ඉන් අනතුරුව අදාළ ප්‍රවීණතා විභාගයට ඔහු පෙනී සිටිය යුතු අතර, එම විභාගයෙන් අසමත් වුවහොත් පූර්ණ වැටුප් සහිත මාස හයක කාල පරිච්ඡේදයෙන් පසු ඒ සමගම එළඹෙන අවුරුදු දෙකක කාල පරිච්ඡේදය තුළ තමාගේ සාමාන්‍ය රාජකාරිවල නිරත වෙමින් සිටිය දී විභාගයෙන් සමත්වීමට ඔහුට අවස්ථාව සලසා දෙනු ලැබේ.

3.1.6 නියමිත අවුරුදු දෙකහමාරක කාල පරිච්ඡේදය තුළ විභාගයෙන් සමත්වීමට නොහැකි වුවහොත් ඔහුගේ සේවය අවසන් කරනු ලැබේ.

3.1.7 රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරක දැනටමත් ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය නිලධාරියකු රාජ්‍ය සේවයෙහි වෙනත් ස්ථිර තනතුරකට පත් කරනු ලැබූ විට යළි පරිවාස කාලසීමාවක් සේවය කරන ලෙස සාමාන්‍යයෙන් ඔහුට නියම කරනු නොලැබේ. එවැනි නිලධාරියෙකු සිය නව තනතුරෙහි කරන සේවය පරීක්ෂා කර බැලීම සඳහා ප්‍රථමයෙන් එම තනතුරෙහි නියමිත කාලසීමාවක් වැඩ බැලීම සඳහා ඔහු පත් කරනු ලැබිය හැකි ය.

3.1.8 (රාජ්‍ය සේවයෙහි දැනටමත් ස්ථිර/තාවකාලික තනතුරු දරන්නා වූ ද වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබුවා වූ ද, අය හැර) තෝරාගනු ලැබූ අපේක්ෂකයන් දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට ශාරීරිකව සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත්වන ලෙස ඔවුනට නියම කරනු ඇත.

**4. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි**

4.1 ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට පත් කරනු ලබන රාජ්‍ය නිලධාරීන් විසින් ඔවුන්ගේ වැටුපෙන් අයකර ගතයුතු යැයි රජය විසින් නියම කරනු ලබන ප්‍රතිශතයක ප්‍රමාණයට සමාන මුදලක් ස්වකීය වැටුපෙන් වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය.

4.2 අර්ථසාධක අරමුදල් පදනම මත ස්ථිර හෝ තාවකාලික තනතුරුවලට පත්කරනු ලැබූ රාජ්‍ය නිලධාරීන් ස්වකීය ඒකාබද්ධ වැටුපෙන් 6%ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතු වන්නේ ය. මුදල් වර්ෂය අවසානයේ දී අනිවාර්ය දායක මුදල් වශයෙන් අරමුදලට බැරකර ඇති මුදල් ප්‍රමාණය මෙන් 150%ක මුදල් ප්‍රමාණයක් රජය විසින් එම අරමුදලට රජයේ දායක මුදල වශයෙන් ගෙවනු ඇත.

4.3 පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලබන රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු උසුලන්නා වූ නිලධාරීන් සහ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබ පළාත් පාලන සේවයේ (විශ්‍රාම වැටුප් සහිත) තනතුරු උසුලන්නා වූ නිලධාරීන්හට පිළිවෙලින් ඔවුන්ගේ පළාත් පාලන සේවයේ සහ රාජ්‍ය සේවයේ තනතුරු සහ විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ.

4.4 විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබූ යුද, නාවික සහ ගුවන් හමුදාවේ නිත්‍ය සේවයෙහි නියුතු පිරිසට ඔවුන්ගේ රාජ්‍ය සේවයෙහි තනතුරු සඳහා විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ. මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත බවට ප්‍රකාශිත තනතුරක රාජ්‍ය නිලධාරියෙක් ලෙස පත්වීමක් භාර ගැනීම සඳහා මුදා හරිණු ලැබූ සන්නද්ධ හමුදාවක යම් සාමාජිකයෙකුගේ සම්පූර්ණ වැටුප් සහිත අහිමි නොවූ සේවා කාලසීමාව මේ ව්‍යවස්ථා සංග්‍රහයේ පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද, මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ගෙවිය යුතු යම් විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයක කාර්යය සඳහා ගණන් ගත යුතු ය.

**5. යුද්ධ සේවා අනුග්‍රහය**

5.1 එක්සත් රාජ්‍ය යුද්ධාවතීරණ හමුදාවන්හි සේවා මුක්ත භටයින් ද, සහාය ගිනි නිවන, ගගන ප්‍රහාර නිවාරණ සහ මහජන ආරක්ෂක සේවාවන්හි පූර්ණකාලීන සාමාජිකයන් වශයෙන් නියුක්තව සිටි තමන්ගේම ඕනෑකමින් එම සේවාවන්ගෙන් අස්ව නොගිය අයට ද ඉහත කී සියලු සුදුසුකම් තිබේ නම් ද ඔවුන් මෙම හමුදාවන්ට බැඳී ඇත්තේ 1954 අගෝස්තු මස 15 වැනි දිනට පෙරාතුව නම් ද, ඔවුන්ගේ එම සේවාවන් සතුටුදායක ලෙස සහ අඛණ්ඩව පැවතිණි නම් ද, වයස අතින් සුදුසුකම් ලබා ගැනීම සඳහා ඔවුන්ට තමන්ගේ වයස්වලින් 1939 සැප්තැම්බර් මස 03 වැනි දින සිට 1949 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා වූ කාලසීමාව තුළ තම තමන් සේවය කළ කාලයන් අඩුකර ගැනීමට ඉඩදෙනු ලැබේ.

**6. රාජ්‍ය සේවයෙහි දැනට සේවය කරන නිලධාරීහු**

6.1 රාජ්‍ය සේවයෙහි දැනට සේවයෙහි යෙදී සිටින්නාවූත්, අවශ්‍ය සියලු සුදුසුකම් ඇත්තාවූත්, නිලධාරීන් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් එවිය යුතුය. නව තනතුරු සඳහා ඉල්ලුම් කරන්නා වූ ද, රාජ්‍ය සේවයෙහි දැනට ස්ථිර තනතුරු දරන්නා වූ ද, නිලධාරීන්ගෙන් යමෙකු නව තනතුරකට තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා ඔවුන් මුදවාලිය හැකි ද නොහැකි ද යන්න එම නිලධාරීන් සේවයෙහි යෙදී සිටින දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් විසින් ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කරන විට සඳහන් කළ යුතු ය.

6.2 නියමිත වේලාවක නියමිත ස්ථානයක දී සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටින ලෙස අයදුම්කරුවන්ට නියම කරනු ලැබිය හැක. මේ සම්බන්ධයෙන් දැරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් ආදියත් ගෙවනු නොලැබේ.

6.3 යම්කිසි අයදුම්කරුවකු නිර්දේශ කිරීමට අදහස් කරන කෙනෙකු විසින් අයදුම්කරුට චරිත සහතිකයක් දීමෙන් එසේ කළ යුතු ය. යම් අයදුම්කරුවකු තෝරා ගන්නා පරිද්දෙන් කවර අන්දමේ වුව ද අයථා අනුග්‍රහයන් පැතීම හෝ එහිලා යම් බලපෑමක් කිරීමට තැත් කිරීම හෝ එම අයදුම්කරු නුසුදුස්සකු කරනු ලැබීමට හේතුවනු ඇත.

6.4 අයදුම්කරුගේ අයදුම්පතෙහි කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැන ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන් ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් ඔහු රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

6.5 මෙම දැන්වීමෙහි සඳහන් වන නියමයන්ට සෑම අතින් ම අනුකූල නොවන අන්දමේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**7. සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප් යන්නෙහි අර්ථ දැක්වීම**

7.1 සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප යන්නෙන් අදහස් කෙරෙනුයේ ඒකාබද්ධ වැටුප පමණකි. වැඩ බැලීමේ වැටුපක් හෝ දීමනා ආදිය ඊට ඇතුළත් නොවන්නේ ය.

**8. බඳවා ගැනීම සහ උසස් කිරීම සම්බන්ධ නව ජාතික ප්‍රතිපත්තිය**

පසුව නිකුත් කෙරෙන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මගින් සංශෝධනය කිරීමට යටත්ව 1990.08.09 දිනැති අංක 15/90, 1990.03.05 දිනැති අංක 15/90(I) සහ 1990.06.15 දිනැති අංක 15/90 (II) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවල දක්වා ඇති ප්‍රතිපත්තියට අනුකූලව රාජ්‍ය සේවයට, පළාත් රාජ්‍ය සේවයට, රාජ්‍ය සංස්ථා අංශයට සහ රජයට සම්පූර්ණයෙන්ම අයත් සමාගම්වලට බඳවා ගැනීම සහ උසස් කිරීම 1990.01.01 වැනි දින සිට සිදුකරනු ඇත.

## විභාග අපේක්ෂකයන් සඳහා නීති සහ උපදෙස්

"1968 අංක 25 දරන විභාග පනතේ දක්වා ඇති විධිවිධානයන්ට අනුකූලව කටයුතු කිරීමට සියලුම විභාගාපේක්ෂකයින් බැඳී ඇත"

සියලු ම විභාගාපේක්ෂකයින් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයෙකුට විභාග කොමසාරිස්ගේ අභිමතය පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබිය හැකිය :-

(i) මුළු විභාගයටම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයයකට හෝ ඉන් කොටසකට පෙනී සිටීම හෝ තහනම් කිරීම,

(ii) විභාගයේ එක් විෂයයකට හෝ මුළු විභාගයටම හෝ නුසුදුස්සෙකු කිරීම,

(iii) එක් අවුරුද්දකට හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,

(iv) මුළු ජීවිත කාලයේ ම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,

(v) සහතික පත්‍රය යම්කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම,

(vi) විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වගකිවයුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයා පොලීසියට භාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතරතුර හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදී වුවත් එවැනි විභාගාපේක්ෂකයෙකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් සතු වේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේ ය. එහෙත් රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳ ව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටත් වන්නේ ය.

1. සියලු ම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසලදීත් විභාග ශාලාධිපතීන්ට ද, ඔහුගේ සහකාරයින්ට ද, අනිකුත් විභාගාපේක්ෂකයින්ට ද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්තදාන්තව හැසිරිය යුතුය. විභාග ශාලාවට ඇතුළු වන විටත්, ඉන් පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

2. විභාගාපේක්ෂකයෝ විභාග ශාලාධිපතීන්ට කීකරු විය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාග ශාලාධිපතීන්ගේ හා ඔහුගේ සහකාරයන්ගේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය.

3. විභාගයේ දී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන්ගෙන පැය භාගයක් ගතවූවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයෙකු විභාග ශාලාවට ඇතුළු කරගනු නොලැබේ. විභාගය පටන් ගෙන පැය භාගයක් ගතවන තුරු ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින අපේක්ෂකයෙකුට විභාග ශාලාවෙන් පිටවී යාම තහනම්ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට පමා වී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සෑම විභාගාපේක්ෂකයෙකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුය. විභාග ශාලාධිපතිගේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුයි. තමන්ට නියම නොකරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට සිදුවේ.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන් ම නිශ්ශබ්ද ව සිටිය යුතු ය. මොන ම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළත දී විභාග ශාලාවේ කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ පිටත හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතාබස් කිරීම හෝ පණිවුඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන්ම තහනම්ය. යම් කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවෙකු සමග කතාබස් කිරීමක් අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාග ශාලාධිපතින්ගේ අවසරය ලබා ගත යුතු යි.

6. විභාගාපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය හඳුනාගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නොලිවිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපේක්ෂකයෙකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් ලෙස සලකනු ලැබේ. හඳුනාගත නොහැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂේප කිරීමට ද සිදුවෙනවා ඇත.

7. තමන් වෙත සපයන ලද කඩදාසි හැර තීන්ත පොවන කඩදාසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කිසි තැනක හෝ කිසිවක් නොලිවිය යුතුය. මේ නීතිය නොසැලකීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමක් ලෙස සැලකිය හැකි වේ.

8. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන පොතක් හෝ ඉරාදැමීම හෝ පොඩි කිරීම හෝ නමා දැමීම හෝ අකාමකා දැමීම හෝ නොකළ යුතුය. කටුවැඩ ආදිය සඳහා පාවිච්චි කරන ලද සෑම කඩදාසියක්ම උත්තර පත්‍රයට ඇමිණිය යුතු ය. ඒවා උත්තර පත්‍රයෙහිම කොටසක් විය යුතු ය. එබඳු කටුවැඩ පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. විභාග ශාලාවේ දී ලියන ලද කිසිම දෙයක් ඉන් පිටත ගෙනයෑම තහනම් ය. එකම ප්‍රශ්නයකට පිළිතුරු දෙතැනක ලියැවී තිබේ නම් අනවශ්‍ය පිළිතුරු පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. මේ කරුණු පැහැර හැරීම වංචාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් සේ සැළකීමට ඉඩ තිබේ.

9. ගණිත ප්‍රශ්නවල දී ගණන් වරදවා සාදා හෝ ගණනක් කොහෙත්ම නොසාදා හෝ නිවැරදි පිළිතුරු දැක්වීමත් චිත්‍ර කර්මයේ දී තමන්ගේ චිත්‍රය තවත් අපේක්ෂකයෙකුගේ චිත්‍රයට ආකල්ප මාත්‍රයෙන් හෝ ස්වරූපයෙන් හෝ ක්‍රියාකාරිත්වයෙන් හෝ යනාදියකින් සමානව, එසේ නැතිනම් බොහෝ සෙයින්ම කිට්ටුවම තිබීමත්, වංචා සහගත ක්‍රියාවක් සේ සලකනු ලැබීමට හේතු විය හැකිය.

10. විභාගයේ දී උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටතට ගෙනයාම තහනම්ය. මේ සියලුම දෑ විභාග කොමසාරිස් සතුය. මේ නීතිය කඩකිරීම වංචනික චේතනාවකින් යුත් ක්‍රියාවක් ලෙස සැලකීමට හේතු විය හැකිය.

11. තමන් වෙත සපයන ලද ලිපිද්‍රව්‍ය හැර වෙනත් පොත්පත්, සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන නෝට් පොත්, ඇක්සයිස් පොත් හා කඩදාසි කොළ හෝ කැබලි ද, තමන්ගේ පාට පෙට්ටි හා පාර්සල් ආදිය ද, පයිල් කවර, කාඩ්බෝඩ් පෑඩ්, නැවු ප්‍රවෘත්ති පත්‍ර, බ්‍රවුන් පේපර් යනාදිය ද, විභාග ශාලාව තුළ සිටින කිසි විටෙක තමා වෙත හෝ සමීපයෙහි හෝ තබා නොගත යුතුය. මේ නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12. විභාග ශාලාව තුළ කිසිම අපේක්ෂකයෙකු අත කිසිම පොතපතක් හෝ සටහන් පොතක් හෝ සටහන් ලියන කඩදාසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන්ම තහනම් ය. විභාග ශාලාධිපතීන් නියම කළහොත් සෑම අපේක්ෂකයෙක්ම තමන් සන්තකව තිබෙන දෑ මේ මේ යයි සහතික කිරීමට බැඳී සිටී. මේ අවශ්‍යතා කඩකිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්න දැරීමක් ලෙස සලකනු ලැබේ.

13. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ පොතපතකින් හෝ පත්‍රයකින් හෝ සටහන් සහිත කොළයකින් හෝ වෙන කිසිවකින් හෝ ගෙන, හොර උත්තර ලිවීම හෙවත් කොපි කිරීම, හොර උත්තර ලිවීමට යත්න දැරීමද තහනම් ය. තවත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීම ද නොකළ යුතුය. වෙන අයදුම්කරුවෙකුට උදව් දීමෙන් ද, වෙන අයදුම්කරුවෙකුගෙන් හෝ පුද්ගලයෙකුගෙන් හෝ උදව් ලබා ගැනීමෙන් ද සම්පූර්ණයෙන්ම වැළකිය යුතුය. උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසිය යට තබා ගත යුතුය. ලියන කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතුය.

14. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත් ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිටවී යාමට කිසිම අපේක්ෂකයෙකු ඉඩදෙනු නොලැබේ. එහෙත් යම්කිසි හදිසි කරුණක් නිසා විභාගාපේක්ෂකයෙකුට ඉන් පිටත යන්නට උවමනා වුවහොත් විභාග ශාලාධිපතිගේ සහකාර නිලධාරියෙකුගේ සුපරීක්ෂාකාරීත්වය යටතේ විභාග ශාලාවෙන් ඔහුට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත් නැවත විභාග ශාලාවට ඇතුළු වන විටත් ඔහු සෝදිසියකට භාජනය විය යුතුය.

15. විභාග ශාලාවේ දී පිළිතුරු ලියන විට විභාගය පටන් ගැනීමට පෙර හෝ නියම විභාග අපේක්ෂකයෙකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයෙකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමත්, කෙනෙකුගේ අනන්‍යතා සහතිකය වෙනස් කිරීමත් එබඳු වරදවල් ය. විභාගාපේක්ෂකයන් එවැනි වරදට අසු නොවිය යුතුය.

16. විභාග අපේක්ෂකයෙකු නොවන අයෙක් කිසිම අපේක්ෂකයෙකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදව් දීම බරපතල වරදක් ලෙස සලකනු ලැබේ.

විභාග අපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය. :—

(i) විභාගය පටන් ගන්නා නියමිත වේලාවට සෑහෙන පමණ කලින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටත් පිරිසෙයින් විනාඩි 10කට හෝ 15කට කලින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරිහැටි නොදත් විට විභාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

(ii) යම්කිසි විෂයයකට ඇතුළත්වීම ගැන හෝ යම් විෂයයකට පෙනී සිටීමට ඇති සුදුසුකම් ගැන හෝ සැකයක් ඇති වූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීමට පටන් ගැනීමට පෙර විභාග ශාලාධිපතීන්ට ඒ බැව් සැළකර එම සැකය දුරුකර ගත යුතුයි. එලෙස ක්‍රියා නොකිරීම එම විෂයය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගාපේක්ෂකත්වය අවලංගු වී යාමට හේතු විය හැකිය.

(iii) විභාගයට පෙනී සිටීමේ දී අපේක්ෂකයන් සෑම විෂයයකටම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතාවය ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවේ දී ඉදිරිපත් නොකළහොත් ඔහුගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාගශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ බැව් විභාග ශාලාධිපතීන්හට දන්වා විභාගය අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සළසා ගත යුතුය.

(iv) විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපිද්‍රව්‍ය (එනම් ලියන කඩදාසි, තීන්ත පොවන කඩදාසි, ලැජර් කඩදාසි, සාරාංශ ලියන කඩදාසි) ආදිය සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයකට වෙනස් වූ හෝ අමුතු මෝස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණහොත් ඒ බව නොපමාව විභාගශාලාධිපතිට දැන්විය යුතුයි. විභාග ශාලාවේ දී ඔබට දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුයි. ඉතිරි වන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝුගණක චක්‍ර සපයන ලද්දේ නම් ඒවා පරිස්සමින් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්නට හැරිය යුතුය.

(v) විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කූඩු, මකන, රෙදි කෑලි, අඩිකෝදු, ජ්‍යාමිතික උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

(vi) තමන් පාවිච්චි කරන සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේ දී නොපමාව තමන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේම පැහැදිලිව ද පිරිසිදුව ද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තිබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලිවීමෙන් පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන සෑම දෙයක්ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නොහැකි ලෙස නොලිවිය යුතුයි.

(vii) උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තීරය වෙන්කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහා ය. දකුණු පැත්තේ තීරය වෙන්කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිවිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයට හේතුවන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

(viii) අනිවාර්ය ප්‍රශ්න ද, තෝරා ගත යුතු අන් ප්‍රශ්න ද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින්ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමින් කියවා බැලිය යුතුයි. මෙය නොසලකා හැරීමෙන් බොහෝ විට පාඩු සිදුවිය හැකිය.

(ix) ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම සහ කටුවැඩ ඒ ඒ ගණන් සෑදීමේ කොටසක් වශයෙන් අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුය. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් හා චිත්‍ර ආදිය නිවැරදිව ද සෑහෙන පමණ විශාලව ද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවල දී එක පිටුවක අඳින ලද රූප සටහන් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමුකර විය යුතු අවස්ථාවල දී ඒ රූප සටහන් නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

(x) එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ලම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙල අනුව එකතුකොට වම් පැත්තේ ඉහළ කෙළවරේ තමන්ට සපයන ලද නූල් කැබැල්ලෙන් නොගැලවී යන පරිදි එකට තබා අමුණා ගැටගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නොගසන්න.

(xi) ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතීන්ට හෝ ඔවුන්ගේ සහකාර මහතකුට හෝ සියතින්ම භාරදිය යුතුය. නැතහොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේම වාඩි වී සිටිය යුතුය. එසේ නොකිරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැති වී යාමට ද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවූවකු සේ සලකනු ලැබීමට ද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියුන් කෙනෙකුට හෝ වෙනයම් සේවකයෙකුට හෝ බාර නොදිය යුතුය.

(xii) යම්කිසි කරුණක් නිසා විභාග ශාලාධිපතීන්ට හෝ ඔහුගේ සහකාර මහතෙකුට හෝ කථා කිරීමට අවශ්‍ය වූ විට ද, කඩදාසි ආදිය අවශ්‍ය වූ විට ද තම ආසනයෙන් නොනැගිට අත පමණක් එසවිය යුතුය.

**විභාග කොමසාරිස් ජනරාල්.**

පැලවත්ත,
බත්තරමුල්ල,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ දී ය.

# තනතුරු - ඇබෑර්තු

## ශ්‍රී ලංකා පොලීසිය

### පොලිස් කොස්තාපල් තනතුර

ශ්‍රී ලංකා පොලීසියේ ආධුනික පොලිස් කොස්තාපල් තනතුර සඳහා ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

02. පහත දක්වනු ලබන ආකෘති පත්‍රය අනුව සකස් කරන ලද අයදුම්පත් අධ්‍යක්ෂ, බඳවා ගැනීම්, ආධුනිකයින් බඳවා ගන්නා කොට්ඨාසය, අංක 375, පළමු මහල, ශ්‍රී සම්බුද්ධත්ව ජයන්ති මාවත, කොළඹ 06, යන ලිපිනයට එවිය යුතු ය. අයදුම්පත් බහා එවනු ලබන කවරයේ වම් කෙළවරේ ඉහළින් තමා අයදුම්කරන තනතුර සඳහන් කර එය ලියාපදිංචි තැපෑලෙන් 2021.03.31 වැනි දිනට හෝ ඊට පෙර ඉහත සඳහන් ලිපිනයට ලැබීමට සැලැස්විය යුතු ය. ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් සම්බන්ධයෙන් ක්‍රියා නොකරනු ලබන අතර ශ්‍රී ලංකා පොලීසිය විසින් අයදුම්පත් නිකුත් කරනු නොලැබේ.

03. *වැටුප් ක්‍රමය* : (මාසිකව)

රු. 29,540 - 7 x 300 - 27 x 270 - රු. 41,630.00

මෙම වැටුප් ගණනය කිරීම රා. ප. ච. 03/2016 අනුව සිදුකර ඇත.

තව ද, මෙම නිලධාරීන් 2013.01.07 වැනි දිනැති පොලිස්පති චක්‍රලේඛ අංක 2416/2013 යටතේ ලබා දී ඇති දීමනාවලට ද හිමිකම් ලබයි. ඉහත සඳහන් වැටුප් පරිමාණයට අමතරව මෙහි පහත සඳහන් දීමනා ඔවුන් වෙත මාසිකව හිමිවනු ඇත.

| | | |
|---|---|---|
| (අ) | ජීවන වියදම් දීමනාව | රු. 7,800 0 |
| (ආ) | රා.ප.ච.03/2016 අනුව තනතුරට අදාළ 40% දීමනාව | රු. 11,816 0 |
| (ඇ) | දුෂ්කර දීමනාව | රු. 2,000 0 |
| (ඈ) | අන්තර් දීමනාව | රු. 2,500 0 |
| (ඉ) | නිල ඇඳුම් පිරිසිදු කිරීමේ දීමනා | රු. 250 0 |
| (ඊ) | සංයුක්ත දීමනා (විශේෂ දීමනා ගෙවනු ලබන ප්‍රදේශ සඳහා උපරිමය) | රු. 10,500 0 |
| (උ) | සංයුක්ත දීමනා (විශේෂ දීමනා ගෙවනු නොලබන ප්‍රදේශ සඳහා උපරිමය) | රු. 9,800 0 |

මෙම දීමනාවලට අමතරව -

(අ) නොමිලේ ගමන් පහසුකම්,

(ආ) නිලධාරින්ට නොමිලේ වෛද්‍ය පහසුකම් (විදේශ රටක දී වුවද ප්‍රතිකාර කිරීමට මුදලින් ආධාර ලබා ගත හැක.)

(ඇ) සියලුම නිල ඇඳුම් නොමිලේ සපයනු ලැබේ.

(ඈ) තමාගේ ක්‍රීඩා කෞශල්‍යය හා සහජ හැකියාවන් දියුණු කර ගැනීමේ පහසුකම්.

(ඉ) රාජකාරී සඳහා ගමන් වියදම් ද දුෂ්කර සේවය හා විශිෂ්ට රාජකාරී සඳහා තෑගි වශයෙන් මුදල් ද ප්‍රදානය කරනු ලැබේ.

04. *අවශ්‍ය මූලික සුදුසුකම්* :

4:1 *වයස් සීමාව* :

*ගැසට්* නිවේදනය අනුව අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු 18-25 ත් අතර විය යුතු ය.

4:2 *අධ්‍යාපන සුදුසුකම්* :

- අ. පො. ස. (සා. පෙළ) විභාගයෙන් මාධ්‍ය භාෂාවට සම්මාන සාමාර්ථයක් සහිතව අපේක්ෂකයෙකු එකවර විෂයන් 06 කින් සමත් විය යුතු අතර, සම්මාන සාමාර්ථ 04ක් තිබිය යුතු ය සහ ගණිතය විෂයය දෙවරකට නොවැඩි වාර ගණනක දී සමත් විය යුතු ය.

**සටහන 01:** ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ විෂයය වර්ගීකරණය අනුව විෂය අංක 41, 44 දරන සෞන්දර්යය විෂය යුගලය එක් විෂයක් ලෙසද අංක 42 සහා 45 දරන සෞන්දර්යය විෂය යුගලය එක් විෂයක් ලෙස ද සලකා විභාගයෙන් සමත් විෂය සංඛ්‍යාව තීරණය කරනු ලැබේ.

**සටහන 02 :** අ.පො.ස (සා. පෙළ) විභාගයේ තාක්ෂණ විෂය ලිඛිත පරීක්ෂණයෙන් අසමත්වීම එම විෂයයේ ප්‍රායෝගික පරීක්ෂණය සමත් වුව ද එම විෂය අසමත් ලෙස සලකනු ලැබේ.

**සටහන 03:** වෛකල්පිත දෙමළ, ඉංග්‍රීසි සහ සිංහල විෂය අ.පො.ස. (සා. පෙළ) විෂයය ධාරාවට ඇතුළත් නොවන හෙයින් එම විෂයයන් සමත්වීම අ.පො.ස (සා. පෙළ) විභාගයෙන් සමත් විෂයයක් ලෙස ගණනය කරනු නොලැබේ.

4:3 *කායික සුදුසුකම්* :

- උස අඩි 05 යි. අඟල් 04 (අවම),
- පපුව අඟල් 30 (අවම/හුස්ම නාල්ලා).

4.3.1 සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරේ රාජකාරි ඉටුකිරීමටත් ප්‍රමාණවත් කායික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

4.3.2 *දෘෂ්ටිය පිළිබඳ අවශ්‍යතාවයන්* .— උපැස් යුවලක් හෝ ස්පර්ශ කාච නොමැතිව එක් එක් ඇසෙහි අවම දෘෂ්ටිය 6/12ට අඩු නොවිය යුතු ය. එක් ඇසක දෘෂ්ටිය 6/6 වන විට අනෙක් ඇසෙහි 6/18 ක් විය යුතුය.

4.3.3 පොලිස් සේවයේ ගරුත්වයට නොගැලපෙන හා රාජකාරිවලට බාධා විය හැකි අන්දමේ කෘත්‍රිම ශාරීරික වෙනස්කම් කර නොතිබිය යුතුය.

4.4 *වෙනත් සුදුසුකම්* :

4.4.1 ශ්‍රී ලංකා පුරවැසියෙකු විය යුතුය.
4.4.2 අයදුම්කරු අයහපත් චරිතයකින් යුක්ත නොවිය යුතුය.
4.4.3 අයදුම්කරු අවිවාහක විය යුතුය. (දික්කසාද වූවන්, වැන්දඹුවන්, සහ අවිවාහකව දරුවන් සිටින අයවලුන් සුදුසුකම් නොලබයි.)
4.4.4 දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට බැඳී සිටිය යුතුය.
4.4.5 තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය වන 4.1 සහ 4.2 යන සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් දිනට සම්පූර්ණ කර තිබිය යුතු අතර 4:4 හි සුදුසුකම් බඳවා ගන්නා දිනට ද ඒ ආකාරයෙන්ම තිබිය යුතුය.

05. *මූලික පරීක්ෂණය* :

අයදුම්පත් ඉදිරිපත් කර ඇති අයදුම්කරුවන් අතරින් මූලික සුදුසුකම් සහ වයස සපුරා ඇති අයදුම්කරුවන් පමණක් මූලික පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ. එම පරීක්ෂණයේ දී ඉහත ඡේද 4.3 (4.3.2 හා 4.3.3. හැර) හා 4.4 (4.4.2 හා 4.4.4 හැර) සුදුසුකම් පරීක්ෂා කරනු ලැබේ.

මූලික පරීක්ෂණයට පෙනී සිටින අයදුම්කරුවන් පොලිස්පති විසින් පත්කරනු ලබන මණ්ඩලයක් විසින් පවත්වනු ලබන ඔරොත්තු දීමේ පරීක්ෂණයට පෙනී සිටිය යුතුය. අයදුම්කරුවන් විසින් ඔරොත්තු දීමේ පරීක්ෂණයට මුහුණදීමට සුදුසු බවට කැඳවීම් ලිපිය සමග අමුණා එවනු ලබන පෝරමය ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ලියාපදිංචි වෛද්‍යවරයෙකුගේ නිර්දේශය සහිතව එම අවස්ථාවේ දී ඉදිරිපත් කළ යුතු ය.

| *ක්‍රියාකාරකම* | *කාලය* | *ලකුණු* |
|---|---|---|
| දුර දිවීම මීටර්/ Run meters 1000 | විනාඩි 03ට අඩුනම් | 30 |
| | විනාඩි 03ත් 04ත් අතර | 20 |
| | විනාඩි 04ත් 05ත් අතර | 10 |
| Chinup (වාර 05ක්) | විනාඩි 01 යි | එක් වාරයකට ලකුණු 03 බැගින් උපරිම ලකුණු 15 කි |
| Pushup (වාර 15ක්) | විනාඩි 01 යි | වාරයකට ලකුණු 01 බැගින් උපරිම ලකුණු 15 |
| Situp (වාර 15ක්) | විනාඩි 01 යි | වාරයකට ලකුණු 01 බැගින් උපරිම ලකුණු 15කි |
| Squat Thrust (වාර 15ක්) | විනාඩි 01 යි | වාරයකට ලකුණු 01 බැගින් උපරිම ලකුණු 15කි |
| Kim Gem (මතකය පරීක්ෂා කිරීම) | අයිතමයන් නිරීක්ෂණය කිරීම සඳහා තත්පර 30 යි, ධාරණය කර ගැනීමට තත්පර 30යි, ලිවීමට තත්පර 120 යි | එක් අයිතමයකට ලකුණු 01 බැගින් උපරිම ලකුණු 10 යි |

සටහන : මීටර් 1000 ක දුරක් විනාඩි 05ක කාලයක දී දිවීමට අසමත් වන අයදුම්කරුවන් යෝග්‍යතා පරීක්ෂණයෙන් අසමත් ලෙස සලකනු ලැබේ.

06. *ලිඛිත විභාගය* :

මූලික පරීක්ෂණයෙන් සමත්වන අයදුම්කරුවන් ලිඛිත විභාගය සඳහා කැඳවනු ලැබේ. ලිඛිත විභාගය පහත විෂයන් යටතේ පවත්වනු ලැබේ.

| *විෂයයන්* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *සමත් ලකුණු ප්‍රමාණය* |
|---|---|---|
| 01. අවබෝධය හා භාෂා හැකියාව | 50 | 40% |
| 02. සාමාන්‍ය දැනීම හා බුද්ධි පරීක්ෂණය | 50 | |

07. *ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය* :

මූලික පරීක්ෂණයෙන් හා ලිඛිත විභාගයෙන් සමත්වන අයදුම්කරුවන් පමණක් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය සඳහා යොමු කරනු ලැබේ. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පොලිස්පති විසින් පත්කරනු ලැබේ.

| ලකුණු ලබාදෙනු ලබන ප්‍රධාන ශීර්ෂ | උපරිම ලකුණු ප්‍රමාණය | තෝරාගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| 01. අතිරේක අධ්‍යාපන සුදුසුකම් | 15 | අදාළ නොවේ. |
| 02. වෘත්තීය සුදුසුකම් | 15 | |
| 03. භාෂා හැකියාව | 10 | |
| 04. ක්‍රීඩා කුසලතා | 20 | |
| 05. නායකත්වය/ප්‍රජා සේවාවන් | 20 | |
| 06. සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ ඇගයීම | 20 | |
| එකතුව | 100 | |

08. *බඳවා ගැනීමේ ක්‍රමය* :

ලිඛිත විභාගයෙන් සහ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයෙන් ලබාගන්නා ලකුණු සංඛ්‍යාව එකතු කොට අයදුම්කරුවන් ලබාගත් මුළු ලකුණු සංඛ්‍යාව අවරෝහණ ක්‍රමයට සකස් කරනු ලැබේ. එම ලකුණු අනුපිළිවෙල අනුව පුරප්පාඩු සංඛ්‍යාව මෙන් 125%ක අයදුම්කරුවන් ගණනක් පසුබිම් පරීක්ෂණ සහ වෛද්‍ය පරීක්ෂණයන්ට කැඳවා ඉන් සමත්වන අයදුම්කරුවන් පවතින පුරප්පාඩු සංඛ්‍යාව මත තනතුරට බඳවා ගනු ලැබේ.

**සටහන**.- ඉහත පටිපාටීන්ට පරිබාහිරව ජාත්‍යන්තර මට්ටමේ, ජාතික මට්ටමේ හෝ විශිෂ්ට ක්‍රීඩා කෞෂල්‍යයකින් යුක්ත වූ හෝ වෙනත් ක්ෂේත්‍රයකින් සුවිශේෂි දක්ෂතා හෝ ප්‍රවීණතා පෙන්නුම් කර ඇති අයදුම්කරුවෙකුගේ උස සහ පපුව පිළිබඳ සුදුසුකම් නොසලකා අනෙකුත් සුදුසුකම් සපුරා ඇත්නම් පත්කිරීම් බලධාරියාගේ අභිමතය පරිදි බඳවා ගත හැකිය.

09. *පසුබිම් පරීක්ෂණය* :

9.1 ලිඛිත පරීක්ෂණයෙන් හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයෙන් අයදුම්කරු ලබාගත් ලකුණු සංඛ්‍යාවේ එකතුව අවරෝහණ ක්‍රමයට සකස් කර එම ලකුණු අනුපිළිවෙළ අනුව සහ පවතින පුරප්පාඩු සංඛ්‍යාව මත අයදුම්කරුවන් සම්බන්ධයෙන් අයහපත් වාර්තා පිළිබඳ පසුබිම් පරීක්ෂණයක් පවත්වනු ලැබේ.

9.2 මෙහිදී අයදුම්කරුගේ අයහපත් චරිතය අනාවරණය කරගැනීම සඳහා ඔහු හා ඔහුගේ සමීප ඥාතීන්ද ඔහු සමීපව ඇසුරු කරන්නන්ගේද අයහපත් චරිතය හා හැසිරීම සම්බන්ධව පරීක්ෂණ පවත්වනු ලබන අතර, අයහපත් පසුබිම් වාර්තා සහිත අයදුම්කරුවන් බඳවා ගනු නොලැබේ.

9.3 බඳවා ගැනීමේදී අයදුම්කරුවන් විසින් අසත්‍ය තොරතුරු සැපයීම ඔහු බඳවා ගැනීමට නුසුදුසුකමක් වේ. අසත්‍ය තොරතුරු සැපයූ බව බඳවා ගැනීමෙන් පසුව හෙළිවුවහොත් ඕනෑම අවස්ථාවකදී සේවයෙන් ඉවත් කරනු ලැබේ.

10. *වෛද්‍ය පරීක්ෂණය* :

අයහපත් පසුබිම් වාර්තා නොමැති අයදුම්කරුවන් පමණක් වෛද්‍ය පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ. තෝරාගත් අයදුම්කරුවන් පොලිස් රෝහලේ ප්‍රධාන වෛද්‍ය නිලධාරියා ඇතුළු වෛද්‍ය මණ්ඩලයක් විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයෙන් සමත් විය යුතු ය. මෙහිදී අයදුම්කරුවන් පොලිස් රාජකාරි සඳහා සුදුසු බවට ශාරීරික හා මානසික යෝග්‍යතාව සම්බන්ධයෙන් වෛද්‍ය පරීක්ෂණයකටද යොමු කරනු ලැබේ. වෛද්‍ය පරීක්ෂණයට භාජනය විය හැක්කේ එක් වරක් පමණි. වෛද්‍ය පරීක්ෂණය සෞඛ්‍ය 169 පෝරමයට අදාළව සිදුකරනු ලබයි. වෛද්‍ය මණ්ඩලය ප්‍රතික්ෂේප කරනු ලබන අයදුම්කරුවන්ට අභියාචනා ඉදිරිපත් කල නොහැක.

11. *පුහුණුව* :

11.1 ඉහත පරීක්ෂණ සියල්ලන්ගෙන් සමත් වන අයදුම්කරුවන් පමණක් පවතින පුරප්පාඩු ප්‍රමාණය මත පොලිස්පති විසින් නියම කරනු ලබන දිනකදී පුහුණුව සඳහා කැඳවනු ලැබේ. මූලික පුහුණුව ශ්‍රී ලංකා පොලිස් විද්‍යාලයේ පවත්වන අතර, ඉන්පසුව ආධුනික කාලය අවසන් වන තෙක් අදාල ක්ෂේත්‍ර පුහුණුව ලබාදීම සිදුකෙරෙයි.

11.2 මූලික පුහුණුව සාර්ථකව අවසන් නොකරන නිලධාරීන්ගේ මූලික පුහුණු කාලය දීර්ඝ කිරීම හෝ අවස්ථානුකූලව පත්වීම අවලංගු කිරීම පත්කිරීම් බලධාරියා විසින් තීරණය කරනු ලැබේ.

12. *තනතුරේ ස්වභාවය* :

ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය.

(විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයන්ට යටත් විය යුතුය)

13. *සේවා කොන්දේසි* :

13.1 තෝරාගනු ලබන අයදුම්කරුවන් ඉහත 13.3 වගන්තියට යටත්ව තුන් (03) අවුරුදු ආධුනික කාලපරිච්ඡේදයක් සම්පූර්ණ කල යුතු ය.

13.2 තෝරාගනු ලබන අයදුම්කරුන් රාජ්‍ය භාෂා ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සඳහා දැනටමත් සම්පාදිතව පවත්නා හ මින්මතු ඒ සම්බන්ධයෙන් සම්පාදනය කරනු ලබන කිසියම් නියෝග වෙතොත් ඒවාද අනුකූලව කටයුතු කළ යුතුය.

13.3 ජාතික පොලිස් කොමිෂන් සභා චක්‍රලේඛ, ආයතන සංග්‍රහයේ විධිවිධාන, මුදල් රෙගුලාසි රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ, භාණ්ඩාගාර චක්‍රලේඛ ශ්‍රී ලංකා පොලිස් නියෝග, පොලිස් ගැසට් නිවේදන, පොලිස්පති චක්‍රලේඛ, පොලිස් උපදෙස් සංග්‍රහවල විධිවිධාන සහ පත්වීම් ලිපියේ ඇතුලත් කොන්දේසිවලටද යටත් විය යුතු යි.

13.4 අධුනික කාලය පත්වීම් දින සිට මුල් වසර 03ක් සඳහා බලපැවැත්වෙන අතර, එම කාලය තුළදී නිලධරයා හට විවාහවීමට අවසර දෙනු නොලැබේ. විවාහ විය හැක්කේ පොලිස් චක්‍රලේඛවලින් ලබා දී ඇති උපදෙස් ප්‍රකාරව පමණි. මෙම රෙගුලාසිය උල්ලංඝනය කලහොත් පත්වීම අවලංගු කරනු ලැබේ.

13.5 බඳවා ගන්නා අයදුම්කරුවන් පුහුණුව අවසන් කිරීමෙන් පසු අවුරුදු 05ක අනිවාර්ය සේවා කාලයක් සේවය කල යුතුය. මෙම අනිවාර්ය සේවා කාලය අවසන් වීමට පෙර යම් නිලධරයෙකු තනතුරින් ඉල්ලා අස්වීමට අදහස් කරන්නේ නම්, ඔහුගේ පුහුණුව හා නිළ ඇඳුම් ඇතුළු අනෙකුත් වියදම් වෙනුවෙන් නියම කරනු ලබන මුදල් සියල්ල ඉල්ලා අස්වීමේ ලිපිය භාරදෙන අවස්ථාවේදී ගෙවීමට කැමැත්ත පලකිරීමේ ගිවිසුමකට එළඹිය යුතුය. ඉල්ලා අස්වීම සම්බන්ධයෙන් ආයතන සංග්‍රහය/කාර්යය පටිපාටික රීති සහ රාජ්‍ය සේවා කොමිෂන් සභා විධිවිධානයන්ට යටත්ව කටයුතු කරනු ලැබේ.

13.6 ඉඳුරාම බඳවාගන්නා සෑම නිලධරයෙකුම පොලිස් සේවයට පළමුවෙන් පත්කරනු ලැබූ විට තමා සතු වූ ස්වකීය අයිතියෙන්ම ඇත්තාවූ හෝ නමට ලියා තිබෙන්නාවූ

හෝ පවරා තිබෙන්නාවූ හෝ සියලුම වත්කම් පිළිබඳව ද තමා විසින් දරනු ලැබූ සියලුම බැරකම් පිළිබඳවද විස්තර සිය පෞද්ගලික ලිපිගොනුවේ ඇතුලත් කිරීම පිණිස (ප්‍රතිශෝධිත) අංක 261 දරන පොදු ආකෘති පත්‍රයේ ඇතුලත් කර පොලිස්පති වෙත සැපයිය යුතු ය.

නිලධරයා විවාහ වූ වහාම ඉහත කී විස්තරය කලත්‍රයා සම්බන්ධවද ඇතුලත් කර සැපයිය යුතුය.

ඉහත විස්තර කර ඇති ආකාරයේ අලුත් අයිතිවාසිකමක් හෝ වත්කමක් හෝ අත්කරගනු ලැබුවහොත් එසේ අත්කර ගන්නා ලද අයිතිවාසිකම හෝ වත්කම පිළිබඳ සම්පූර්ණ විස්තර තමාගේ පුද්ගලික ලිපිගොනුවේ ඇතුළත් කිරීම සඳහා සෑම නිලධරයෙකු විසින්ම පොලිස්පති වෙත ලිඛිතව දැන්විය යුතු ය.

13.7 ආධුනික පොලිස් කොස්තාපල් නිලධරයන් ශ්‍රී ලංකා පොලිස් විද්‍යාලයේ පුහුණුව ආරම්භ කළ වහාම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුකූලව ක්‍රියා කරන බවට ප්‍රතිඥා දිවුරුම් දිය යුතුය.

14. *පත්වීම ස්ථිර කිරීම* :

ඉදුරාම බඳවා ගන්නා නිලධාරීන්ගේ වසර 03ක පරිවාස කාලය අවසානයේදී නිලධරයින්ගේ සේවය පත්කිරීම් බලධරයා විසින් ස්ථිර කරනු ලැබේ. පරිවාස කාලය තුළදී පලමුවන කාර්යක්ෂමතා කඩඉම සමත්වීමට අසමත් වුවහොත් නිලධරයාගේ ජ්‍යෝෂ්ඨත්වය ගතවන අමතර කාලය මත කාර්යය පටිපාටික රීති අනුව තීරණය කර සේවය ස්ථිර කරනු ලැබේ.

එසේ වුවද අමතර වසර 03ක කාලය තුළ පලමු වන කාර්යක්ෂමතා කඩඉම සමත්වීමට අපොහොසත්වන නිලධරයන්ගේ පත්වීම ස්ථිර කිරීම හෝ පරිවාස කාලය දීර්ඝ කිරීම සම්බන්ධව පත්කිරීම් බලධාරියා විසින් තීරණය කලහොත් මිස පත්වීම අවසන් කරනු ලැබේ.

15. *කාර්යක්ෂමතා කඩඉම* :

කාර්යක්ෂමතා කඩඉම ක්‍රියාත්මක කිරීම පහත පරිදි වේ.

| *කුමන කාර්යක්ෂමතා කඩඉම ද යන වග* | *කාර්යක්ෂමතා කඩඉම සමත් විය යුත්තේ කොපමණ වසර ගණනකට පෙරද* | *කාර්යක්ෂමතා කඩඉමේ ස්වභාවය ලිඛිත පරීක්ෂණය/වෘත්තීය පරීක්ෂණය/සහතික පාඨමාලාව/වෙනත්* |
|---|---|---|
| 1 වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ (සේවය ස්ථිර කිරීමේ පරීක්ෂණය) | පොලිස් කොස්තාපල් තනතුරට පත්වී වසර 03ක් ගතවීමට පෙර | ලිඛිත, ප්‍රායෝගික හා වාචික |
| 2 වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය | පොලිස් සැරයන් තනතුරට පත්වී වසර 03ක් ගතවීමට පෙර | තනතුරට හැඩගැස්සීමේ පුහුණු පාඨමාලාව සාර්ථකව හදරා අවසන් කිරීම |
| 3 වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය | පොලිස් මහසැරයන් තනතුරට පත්වී වසර 03ක් ගතවීමට පෙර | තනතුරට හැඩ ගැස්සීමේ පුහුණු පාඨමාලාව සාර්ථකව හදරා අවසන් කිරීම |

16. *භාෂා ප්‍රවීණතාව* :

| භාෂාව | ලබාගත යුතු ප්‍රවීණතාව |
|---|---|
| රාජ්‍ය භාෂාව | රාජ්‍ය භාෂාවක් නොවන භාෂා මාධ්‍යයකින් සේවයට බැඳුණු නිලධාරීන් විසින් නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතාව පරිවාස කාලය තුල ලබාගත යුතුය. |
| අනෙක් රාජ්‍ය භාෂාව | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 01/2014 හා ඊට අනුෂාංගික චක්‍රලේඛ අනුව අදාළ මට්ටමේ ප්‍රවීණතාව ලබාගත යුතුය. |

17. (අ) මෙම *ගැසට් පත්‍රයේ* I කොටස(IIඅ) වැනි ඡේදයේ ආරම්භයේ පළ කරන ලද රාජ්‍ය සේවා තනතුරුවලට පත්කිරීම් සම්බන්ධයෙන් අදළ වන පොදු කොන්දේසි බලපානු ඇත.

18. අයදුම්කරුවන් පහත දැක්වෙන ලිපි ලේඛනවල පිටපත් ස්වකීය අයදුම්පත්‍රවලට අමුණා එවිය යුතු ය. (මුල් ලිපි ලේඛන ඉදිරිපත් නොකළ යුතු ය.) :-

(*අ*) උප්පැන්න සහතිකය,

(*ආ*) ජාතික හැඳුනුම්පතෙහි ඡායා පිටපතක්

(*ඇ*) අධ්‍යාපන සුදුසුකම් සනාථ කිරීම සඳහා වූ සහතික,

19. (*අ*) දැනටමත් රාජ්‍ය සේවයෙහි නියුතුව සිටින අයදුම්කරුවන් ඔවුන්ගේ අයදුම්පත අදාළ ආයතන ප්‍රධානීන් මගින් ඉදිරිපත් කළ යුතු ය. අයදුම්කරු තෝරා ගන්නා ලද්දේ නම් ඔහු නිදහස් කළ හැකි බවට සහතිකයක් අමුණා එවිය යුතුය.

(*ආ*) අයදුම්කරු විසින් අයදුම්පත අඟල් 11 x 8 ප්‍රමාණයේ කඩදාසිවල ස්වකීය අත් අකුරුවලින්ම සම්පූර්ණ කර අදාළ සහතික පිටපත් සමග ඉහත දෙවැනි ඡේදයේ දක්වා ඇති ලිපිනයට ලැබෙන සේ එවිය යුතු අතර කුමන හෝ හේතුවක් නිසාවත් එය කිසියම් නිලධාරියකු වෙත පෞද්ගලිකව භාර නොදිය යුතු ය.

20. මෙම නිවේදනයෙහි දක්වා ඇති අවශ්‍යතාවන් සෑම අයුරකින්ම සනාථ නොකරන අයදුම්පත් ප්‍රතික්ෂේප කෙරෙනු ඇත. එබඳු අයදුම්කරුවන්ට ඒ සම්බන්ධයෙන් පිළිතුරු එවනු නොලැබේ.

*සටහන.*— පරීක්ෂණ හා සම්මුඛ පරීක්ෂණවලට කැඳවනු ලබන අයදුම්කරුවන්ට ගමන් වියදම් හෝ අනෙකුත් වියදම් කිසිවක් ශ්‍රී ලංකා පොලීසිය විසින් ගෙවනු නොලැබේ.

සී. ඩී. වික්‍රමරත්න,
පොලිස්පති.

පොලිස් මූලස්ථානය,
කොළඹ 01.

ආදර්ශ අයදුම්පත්‍රය

| |
|---|
| කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා<br>2" x 2 1/2" ප්‍රමාණය |

**ශ්‍රී ලංකා පොලීසිය**

ආධුනික පොලිස් කොස්තාපල් තනතුර

01. (*අ*) සම්පූර්ණ නම :————.
(පැහැදිලි ලොකු අකුරෙන්) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ හැඳුනුම්පතේ සඳහන් කර ඇති පරිදිම විය යුතුය.

(*ආ*) නම (මුලකුරු සමග) :————.

(*ඇ*) අයදුම් කරන තනතුර :————.

02. ජාතික හැඳුනුම්පත් අංකය :————.
(ජාතික හැඳුනුම්පතේ ඡායා පිටපතක් අමුණා එවිය යුතුය.)

03. පියාගේ සම්පූර්ණ නම :————.

04. අයදුම්කරු උපන් ස්ථානය :————.

උපන් ස්ථානයට අදාළ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය :————. පළාත :————.

05. (*අ*) වර්තමාන ලිපිනය :————.
(*ආ*) වර්තමාන ලිපිනයට අදාළ පොලිස් ස්ථානය :————.
(*ඇ*) ස්ථිර ලිපිනය :————.
(*ඈ*) ස්ථිර ලිපිනයට අදාළ පොලිස් ස්ථානය :————.
(*ඉ*) ලිපි හුවමාරු කළයුතු ලිපිනය :————.
(*ඊ*) ස්ථිර ලිපිනයට අදාළ ග්‍රාම නිලධාරි වසම :————.
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය :————.
(*උ*) දුරකථන අංකය : නිවස :————. ජංගම :————.
(*ඌ*) විද්‍යුත් තැපැල් ලිපිනය :————.

06. (*අ*) ජන වර්ගය :————.
(*ආ*) ඔබ ශ්‍රී ලංකා පුරවැසියෙකු වූයේ පරම්පරාවෙන් ද ? *නැතහොත්* ලියාපදිංචි කිරීමෙන් ද ? (ලියාපදිංචි වීමෙන් නම් එම සහතිකයේ පිටපතක් අමුණන්න) :————.

(*ඇ*) ඔබ පුරවැසියකු වූයේ පරම්පරාවෙන් නම් උපන් ස්ථානය :————.
* අයදුම්කරු :————.
* අයදුම්කරුගේ පියා :————.
* අයදුම්කරුගේ පිය පාර්ශවයේ මුත්තා :————.
* අයදුම්කරුගේ පිය පාර්ශවයේ මී මුත්තා :————.

07. උපන් දිනය :————. (උප්පැන්න සහතිකයේ ඡායා පිටපතක් ඇමිණිය යුතුයි.)
වයස : (*ගැසට්* නිවේදනය අනුව අයදුම්පත් භාරගන්නා අවසන් දිනට)
අවුරුදු :————. මාස :————. දින :————.

08. උස : අඩි :————. අඟල් :————.

පපුව : අඟල් :————.

09. අධ්‍යාපන සුදුසුකම් : (සමත් වී ඇති විභාගයන් සඳහන් කර සහතිකවල පිටපත් අමුණා එවිය යුතුය) :————.

10. විවාහක/අවිවාහක බව :————.

11. (*අ*) දැනට කරන රැකියාව :————.
(*ආ*) ඔබ සන්නද්ධ සේවාවක සාමාජිකයෙක් ද ? :————.

12. ඔබ මීට පෙර ශ්‍රී ලංකා පොලීසියේ සේවය කර තිබේද ?
තනතුර සහ නිල අංකය :————.
එසේ නම් ඔබ තනතුරින් ඉවත් වූ හේතු සඳහන් කරන්න. :————.

13. (*අ*) ඔබ සන්නද්ධ සේවයක සේවය කරන්නේ ද? එසේ නම් අයදුම්පත අදාළ හමුදා ප්‍රධානියාගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය. :————.

(*ආ*) ඔබ සන්නද්ධ සේවාවක සේවය කර ඇත් ද ? එසේ නම් අස්වීමේ දී දෙන සහතිකයේ ඡායා පිටපතක් අමුණන්න :————.

14. (*අ*) ඔබ සන්නද්ධ ස්වේච්ඡා සේවයට අනුයුක්තව සිටින්නේ ද ? එසේ නම් අයදුම්පත හමුදා ප්‍රධානියාගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය. :————.

(*ආ*) ඔබ සන්නද්ධ ස්වේච්ඡා සේවයෙහි අනුයුක්තව සිටියේ ද ? එසේ නම් අස්වීමේ දී දෙන සහතිකයේ ඡායා පිටපතක් අමුණන්න. :————.

15. ඔබ කිසියම් වරදක් සම්බන්ධයෙන් හෝ සැකපිට අත් අඩංගුවට ගෙන තිබේ ද ? එසේම යම් වරදක් සම්බන්ධයෙන් චෝදනා ලැබ හෝ උසාවියට කැඳවනු ලැබ හෝ දඬුවම් ලැබ හෝ ඇත් ද ? (එසේ නම් විස්තර සඳහන් කරන්න) :————.

16. ඔබගේ කිසියම් ඥාතියෙකු යම් වරදක් සම්බන්ධයෙන් හෝ සැකපිට අත් අඩංගුවට ගෙන තිබේ ද ? එසේ නම් කිසියම් වරදක් සම්බන්ධයෙන් චෝදනා ලැබ හෝ උසාවියකට

කැඳවනු ලැබ හෝ දඬුවම් ලැබ ඇත් ද ? එසේ නම් විස්තර සඳහන් කරන්න :———.

ඉහත කරුණු මාගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට සත්‍ය හා නිවැරදි ඒවා බවට මින් සහතික කරමි. එසේම ඉහත දැක්වූ තොරතුරු වැරදි හා අසත්‍ය ඒවා බවට හෙළිවුවහොත් මා සේවයට පත්කර ගෙන ඇතත් ඕනෑම අවස්ථාවක දී ශ්‍රී ලංකා පොලීසියේ සේවය වහාම නතර කිරීමට යටත් වන බව දනිමි.

———,
අයදුම්කරුගේ අත්සන.

දිනය :———.

17. ආයතන ප්‍රධානියාගේ සහතිකය : (අදාළ නම් පමණි)

මෙම අයදුම්පත ඉදිරිපත් කරන .......................... මයා .................... දෙපාර්තමේන්තුවේ/ සංස්ථාවේ/ මණ්ඩලයේ සේවයේ නියුතු අයකු බවත් ඔහු මෙම තනතුර සඳහා තෝරා ගනු ලැබුවහොත් සේවයෙන් මුදා හැරිය හැකි බවත් ප්‍රකාශ කරමි.

———,
ආයතන ප්‍රධානියාගේ අත්සන
සහ නිල මුද්‍රාව.

තනතුර :———.

දිනය :———.

02-381/1

---

## ශ්‍රී ලංකා පොලීසිය

### කාන්තා පොලිස් කොස්තාපල් තනතුර

ශ්‍රී ලංකා පොලීසියේ ආධුනික කාන්තා පොලිස් කොස්තාපල් තනතුර සඳහා ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

02. පහත දක්වනු ලබන ආකෘති පත්‍රය අනුව සකස් කරන ලද අයදුම්පත් අධ්‍යක්ෂ, බඳවා ගැනීම්, ආධුනිකයින් බඳවා ගන්නා කොට්ඨාසය, අංක 375, පළමු මහල, ශ්‍රී සම්බුද්ධත්ව ජයන්ති මාවත, කොළඹ 06, යන ලිපිනයට එවිය යුතු ය. අයදුම්පත් බහා එවනු ලබන කවරයේ වම් කෙළවරේ ඉහළින් තමා අයදුම්කරන තනතුර සඳහන් කර එය ලියාපදිංචි තැපෑලෙන් 2021.03.31 වැනි දිනට හෝ ඊට පෙර ඉහත සඳහන් ලිපිනයට ලැබීමට සැලැස්විය යුතු ය. ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් සම්බන්ධයෙන් ක්‍රියා නොකරනු ලබන අතර ශ්‍රී ලංකා පොලීසිය විසින් අයදුම්පත් නිකුත් කරනු නොලැබේ.

03. *වැටුප් ක්‍රමය* : (මාසිකව)

රු. 29,540 - 7 x 300 - 27 x 270 - රු. 41,630.00

මෙම වැටුප් ගණනය කිරීම රා. ප. ච. 03/2016 අනුව සිදුකර ඇත.

තවද මෙම නිලධාරිනියන් 2013.01.07 වැනි දිනැති පොලිස්පති චක්‍රලේඛ අංක 2416/2013 යටතේ ලබාදී ඇති දීමනාවලට ද හිමිකම් ලබයි. ඉහත සඳහන් වැටුප් පරිමාණයට අමතරව මෙහි පහත සඳහන් දීමනා ඔවුන් වෙත මාසිකව හිමිවනු ඇත.

| | | |
|---|---|---|
| (*අ*) | ජීවන වියදම් දීමනාව | රු. 7,800 0 |
| (*ආ*) | රා.ප.ච.03/2016 අනුව තනතුරට අදාළ 40% දීමනාව | රු. 11,816 0 |
| (*ඇ*) | දුෂ්කර දීමනාව | රු. 2,000 0 |
| (*ඈ*) | අන්තර් දීමනාව | 2,500 0 |
| (*ඉ*) | නිල ඇඳුම් පිරිසිදු කිරීමේ දීමනා | රු. 250 0 |
| (*ඊ*) | සංයුක්ත දීමනා (විශේෂ දීමනා ගෙවනු ලබන ප්‍රදේශ සඳහා උපරිමය) | රු. 10,500 0 |
| (*උ*) | සංයුක්ත දීමනා (විශේෂ දීමනා ගෙවනු නොලබන ප්‍රදේශ සඳහා උපරිමය) | රු. 9,800 0 |

මෙම දීමනාවලට අමතරව -

(*අ*) නොමිලේ ගමන් පහසුකම්,

(*ආ*) නිලධාරිනියන්ට නොමිලේ වෛද්‍ය පහසුකම් (විදේශ රටක දී වුවද ප්‍රතිකාර කිරීමට මුදලින් ආධාර ලබා ගත හැක.)

(*ඇ*) සියලුම නිල ඇඳුම් නොමිලේ සපයනු ලැබේ.

(*ඈ*) තමාගේ ක්‍රීඩා කෞශල්‍ය හා සහජ හැකියාවන් දියුණු කර ගැනීමේ පහසුකම්.

(*ඉ*) රාජකාරි සඳහා ගමන් වියදම් ද දුෂ්කර සේවය හා විශිෂ්ට රාජකාරි සඳහා තෑගි වශයෙන් මුදල් ද ප්‍රදානය කරනු ලැබේ.

04. *අවශ්‍ය මූලික සුදුසුකම්* :

4:1 *වයස් සීමාව* :

*ගැසට්* නිවේදනය අනුව අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු 18-25 ත් අතර විය යුතු ය.

4:2 *අධ්‍යාපන සුදුසුකම්* :

- අ. පො. ස. (සා. පෙළ) විභාගයෙන් මාධ්‍ය භාෂාවට සම්මාන සාමාර්ථයක් සහිතව අපේක්ෂකයෙකු එකවර විෂයන් 06 කින් සමත් විය යුතු අතර, සම්මාන සාමාර්ථ 04ක් තිබිය යුතු ය. සහ ගණිතය විෂයය දෙවරකට නොවැඩි වාර ගණනකදී සමත් විය යුතු ය.

සටහන 01: ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ විෂය වර්ගීකරණය අනුව විෂය අංක 41, 44 දරන සෞන්දර්යය විෂය යුගලය එක් විෂයක් ලෙස ද අංක 42 සහා 45 දරන සෞන්දර්යය විෂය යුගලය එක් විෂයක් ලෙස ද සලකා විභාගයෙන් සමත් විෂයය සංඛ්‍යාව තීරණය කරනු ලැබේ.

සටහන 02 : අ.පො.ස (සා. පෙළ) විභාගයේ තාක්ෂණ විෂයය ලිඛිත පරීක්ෂණයෙන් අසමත්වීම එම විෂයයේ ප්‍රායෝගික පරීක්ෂණය සමත් වුව ද එම විෂයය අසමත් ලෙස සලකනු ලැබේ.

සටහන 03: වෛකල්පිත දෙමළ, ඉංග්‍රීසි සහ සිංහල විෂයය අ.පො.ස. (සා. පෙළ) විෂයය ධාරාවට ඇතුළත් නොවන හෙයින් එම විෂයයන් සමත්වීම අ.පො.ස (සා. පෙළ) විභාගයෙන් සමත් විෂයයක් ලෙස ගණනය කරනු නොලැබේ.

4.3 *කායික සුදුසුකම්* :

- උස අඩි 05 යි. අඟල් 01 යි. (අවම),

4.3.1 සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරේ රාජකාරි ඉටුකිරීමටත් ප්‍රමාණවත් කායික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

4.3.2 *දෘෂ්ටිය පිළිබඳ අවශ්‍යතාවයන් .*— උපැස් යුවලක් හෝ ස්පර්ශ කාච නොමැතිව එක් එක් ඇසෙහි අවම දෘෂ්ටිය 6/12ට අඩු නොවිය යුතු ය. එක් ඇසක දෘෂ්ටිය 6/6 වන විට අනෙක් ඇසෙහි 6/18 ක් විය යුතුය.

4.3.3 පොලිස් සේවයේ ගරුත්වයට නොගැලපෙන හා රාජකාරිවලට බාධා විය හැකි අන්දමේ කෘතිම ශාරීරික වෙනස්කම් කර නොතිබිය යුතුය.

4.4 *වෙනත් සුදුසුකම්* :

4.4.1 ශ්‍රී ලංකා පුරවැසියෙකු විය යුතුය.
4.4.2 අයදුම්කාරිය අයහපත් චරිතයකින් යුක්ත නොවිය යුතුය.
4.4.3 අයදුම්කාරිය අවිවාහක විය යුතුය. (දික්කසාද වූවන්, වැන්දඹුවන්, ගර්භණීව සිටීම සහ අවිවාහකව දරුවන් සිටින අයවලුන් සුදුසුකම් නොලබයි.)
4.4.4 දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට බැඳී සිටිය යුතුය.
4.4.5 තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය වන 4.1 සහ 4.2 යන සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් දිනට සම්පූර්ණ කර තිබිය යුතු අතර 4:4 හි සුදුසුකම් බඳවා ගන්නා දිනටද ඒ ආකාරයෙන්ම තිබිය යුතුය.

05. *මූලික පරීක්ෂණය* :

අයදුම්පත් ඉදිරිපත් කර ඇති අයදුම්කාරියන් අතරින් මූලික සුදුසුකම් සහ වයස සපුරා ඇති අයදුම්කාරියන් පමණක් මූලික පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ. එම පරීක්ෂණයේදී ඉහත ඡේද 4.3 (4:3:2 හා 4:3:3 හැර) 4.4 (4:4:2 හා 4:4:4 හැර) සුදුසුකම් පරීක්ෂා කරනු ලැබේ.

මූලික පරීක්ෂණයට පෙනී සිටින අයදුම්කාරියන් පොලිස්පති විසින් පත්කරනු ලබන මණ්ඩලයක් විසින් පවත්වනු ලබන ඔරොත්තු දීමේ පරීක්ෂණයට පෙනී සිටිය යුතුය. අයදුම්කාරියන් විසින් ඔරොත්තු දීමේ පරීක්ෂණයට මුහුණදීමට සුදුසු බවට කැඳවීම් ලිපිය සමග අමුණා එවනු ලබන පෝරමය ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ලියාපදිංචි වෛද්‍යවරයෙකුගේ නිර්දේශය සහිතව එම අවස්ථාවේදී ඉදිරිපත් කළ යුතු ය.

| ක්‍රියාකාරකම | කාලය | ලකුණු |
|---|---|---|
| දුර දිවීම මීටර් /Run meters 1000 | විනාඩි 03ට අඩුනම් | 30 |
| | විනාඩි 03ත් 04ත් අතර | 20 |
| | විනාඩි 04ත් 05ත් අතර | 10 |
| Chinup (වාර 05ක්) | විනාඩි 01 යි | එක් වාරයකට ලකුණු 03 බැගින් උපරිම ලකුණු 15 කි |
| Pushup (වාර 15ක්) | විනාඩි 01 යි | වාරයකට ලකුණු 01 බැගින් උපරිම ලකුණු 15කි |
| Situp (වාර 15ක්) | විනාඩි 01 යි | වාරයකට ලකුණු 01 බැගින් උපරිම ලකුණු 15කි |
| Squat Thrust (වාර 15ක්) | විනාඩි 01 යි | වාරයකට ලකුණු 01 බැගින් උපරිම ලකුණු 15කි |
| Kim Gem (මතකය පරීක්ෂා කිරීම) | අයිතමයන් නිරීක්ෂණය කිරීම සඳහා තත්පර 30 යි ධාරණය කර ගැනීමට තත්පර 30යි. ලිවීමට තත්පර 120 යි | එක් අයිතමයකට ලකුණු 01 බැගින් උපරිම ලකුණු 10 යි |

*සටහන* : මීටර් 1000 ක දුරක් විනාඩි 05ක කාලයකදී දිවීමට අසමත් වන අයදුම්කාරියන් යෝග්‍යතා පරීක්ෂණයෙන් අසමත් ලෙස සලකනු ලැබේ.

06. ලිඛිත විභාගය :

මූලික පරීක්ෂණයෙන් සමත් වන අයදුම්කරුවන් ලිඛිත විභාගය සඳහා කැඳවනු ලැබේ. ලිඛිත විභාගය පහත විෂයන් යටතේ පවත්වනු ලැබේ.

| විෂයයන් | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| 01. අවබෝධය හා භාෂා හැකියාව | 50 | 40% |
| 02. සාමාන්‍ය දැනීම හා බුද්ධි පරීක්ෂණය | 50 | |

07. *ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය* :

මූලික පරීක්ෂණයෙන් හා ලිඛිත විභාගයෙන් සමත් වන අයදුම්කාරියන් පමණක් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය සඳහා යොමු කරනු ලැබේ. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පොලිස්පති විසින් පත් කරනු ලැබේ.

| ලකුණු ලබාදෙනු ලබන ප්‍රධාන ශීර්ෂ | උපරිම ලකුණු ප්‍රමාණය | තෝරාගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| 01. අතිරේක අධ්‍යාපන සුදුසුකම් | 15 | අදාළ නොවේ. |
| 02. වෘත්තීය සුදුසුකම් | 15 | |
| 03. භාෂා හැකියාව | 10 | |
| 04. ක්‍රීඩා කුසලතා | 20 | |
| 05. නායකත්වය/ප්‍රජා සේවාවන් | 20 | |
| 06. සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ ඇගයීම | 20 | |
| එකතුව | 100 | |

08. *බඳවා ගැනීමේ ක්‍රමය* :

ලිඛිත විභාගයෙන් සහ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයෙන් ලබාගන්නා ලකුණු සංඛ්‍යාව එකතු කොට අයදුම්කාරියන් ලබාගත් මුළු ලකුණු සංඛ්‍යාව අවරෝහණ ක්‍රමයට සකස් කරනු ලැබේ. එම ලකුණු අනුපිළිවෙල අනුව පුරප්පාඩු සංඛ්‍යාව මෙන් 125%ක අයදුම්කාරියන් ගණනක් පසුබිම් පරීක්ෂණ සහ වෛද්‍ය පරීක්ෂණයන්ට කැඳවා ඉන් සමත්වන අයදුම්කාරියන් පවතින පුරප්පාඩු සංඛ්‍යාව මත තනතුරට බඳවා ගනු ලැබේ.

*සටහන*.- ඉහත පටිපාටීන්ට පරිබාහිරව ජාත්‍යන්තර මට්ටමේ, ජාතික මට්ටමේ හෝ විශිෂ්ට ක්‍රීඩා කෞශල්‍යයකින් යුක්ත වූ හෝ වෙනත් ක්ෂේත්‍රයකින් සුවිශේෂී දක්ෂතා හෝ ප්‍රවීණතා පෙන්නුම් කර ඇති අයදුම්කාරියගේ උස පිළිබඳ සුදුසුකම් නොසලකා අනෙකුත් සුදුසුකම් සපුරා ඇත්නම් පත්කිරීම් බලධාරියාගේ අභිමතය පරිදි බඳවා ගත හැකිය.

09. *පසුබිම් පරීක්ෂණය* :

9.1 ලිඛිත පරීක්ෂණයෙන් හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයෙන් අයදුම්කාරිය ලබාගත් ලකුණු සංඛ්‍යාවේ එකතුව අවරෝහණ ක්‍රමයට සකස් කර එම ලකුණු අනුපිළිවෙළ අනුව සහ පවතින පුරප්පාඩු සංඛ්‍යාව මත අයදුම්කාරියන් සම්බන්ධයෙන් අයහපත් වාර්තා පිළිබඳව පසුබිම් පරීක්ෂණයක් පවත්වනු ලැබේ.

9.2 මෙහිදී අයදුම්කාරියගේ අයහපත් චරිතය අනාවරණය කරගැනීම සඳහා ඇය හා ඇයගේ සමීප ඥාතීන්ද ඇය සමීපව ඇසුරු කරන්නන්ගේද අයහපත් චරිතය හා හැසිරීම සම්බන්ධව පරීක්ෂණ පවත්වනු ලබන අතර, අයහපත් පසුබිම් වාර්තා සහිත අයදුම්කාරියන් බඳවා ගනු නොලැබේ.

9.3 බඳවා ගැනීමේදී අයදුම්කාරියන් විසින් අසත්‍ය තොරතුරු සැපයීම ඇය බඳවා ගැනීමට නුසුදුසුකමක් වේ. අසත්‍ය තොරතුරු සැපයූ බව බඳවා ගැනීමෙන් පසුව හෙලිවුවහොත් ඕනෑම අවස්ථාවක දී සේවයෙන් ඉවත් කරනු ලැබේ.

10. *වෛද්‍ය පරීක්ෂණය* :

අයහපත් පසුබිම් වාර්තා නොමැති අයදුම්කාරියන් පමණක් වෛද්‍ය පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ. තෝරාගත් අයදුම්කාරියන් පොලිස් රෝහලේ ප්‍රධාන වෛද්‍ය නිලධාරියා ඇතුළු වෛද්‍ය මණ්ඩලයක් විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයෙන් සමත් විය යුතු ය. මෙහිදී අයදුම්කාරියන් පොලිස් රාජකාරි සඳහා සුදුසු බවට ශාරීරික හා මානසික යෝග්‍යතාව සම්බන්ධයෙන් වෛද්‍ය පරීක්ෂණයකටද යොමු කරනු ලැබේ. වෛද්‍ය පරීක්ෂණයට භාජනය විය හැක්කේ එක් වරක් පමණි. වෛද්‍ය පරීක්ෂණය සෞඛ්‍ය 169 පෝරමයට අදාළව සිදුකරනු ලබයි. වෛද්‍ය මණ්ඩලය ප්‍රතික්ෂේප කරනු ලබන අයදුම්කාරියන්ට අභියාචනා ඉදිරිපත් කළ නොහැක.

11. *පුහුණුව* :

11.1 ඉහත පරීක්ෂණ සියල්ලන්ගෙන් සමත් වන අයදුම්කාරියන් පමණක් පවතින පුරප්පාඩු ප්‍රමාණය මත පොලිස්පති විසින් නියම කරනු ලබන දිනකදී පුහුණුව සඳහා කැඳවනු ලැබේ. මූලික පුහුණුව ශ්‍රී ලංකා පොලිස් විද්‍යාලයේ පවත්වන අතර, ඉන්පසුව ආධුනික කාලය අවසන් වන තෙක් අදාළ ක්ෂේත්‍ර පුහුණුව ලබාදීම සිදුකෙරෙයි.

11.2 මූලික පුහුණුව සාර්ථකව අවසන් නොකරන නිලධාරියන්ගේ මූලික පුහුණු කාලය දීර්ඝ කිරීම හෝ අවස්ථානුකූලව පත්වීම අවලංගු කිරීම පත්කිරීම් බලධාරියා විසින් තීරණය කරනු ලැබේ.

12. *තනතුරේ ස්වභාවය* :

ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය.

(විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයන්ට යටත්විය යුතුය)

13. *සේවා කොන්දේසි* :

13.1 තෝරාගනු ලබන අයදුම්කාරියන් ඉහත 13.3 වගන්තියට යටත්ව තුන් (03) අවුරුදු ආධුනික කාලපරිච්ඡේදයක් සම්පූර්ණ කළයුතු ය.

13.2 තෝරාගනු ලබන අයදුම්කාරියන් රාජ්‍ය භාෂා ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සඳහා දැනටමත් සම්පාදිතව පවත්නා සහ මින්මතු ඒ සම්බන්ධයෙන් සම්පාදනය කරනු ලබන කිසියම් නියෝග වෙතොත් ඒවාටද අනුකූලව කටයුතු කළ යුතුය.

13.3 ජාතික පොලිස් කොමිෂන් සභා චක්‍රලේඛ, ආයතන සංග්‍රහයේ විධිවිධාන, මුදල් රෙගුලාසි රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ, භාණ්ඩාගාර චක්‍රලේඛ ශ්‍රී ලංකා පොලිස් නියෝග, පොලිස් ගැසට් නිවේදන, පොලිස්පති චක්‍රලේඛ, පොලිස් උපදෙස් සංග්‍රහවල විධිවිධාන සහ පත්වීම් ලිපියේ ඇතුලත් කොන්දේසිවලටද යටත් විය යුතු යි.

13.4 අධුනික කාලය පත්වීම් දින සිට මුල් වසර 03ක් සඳහා බලපැවැත්වෙන අතර, එම කාලය තුළදී නිලධරයා හට

විවාහවීමට අවසර දෙනු නොලැබේ. විවාහ විය හැක්කේ පොලිස් චක්‍රලේඛවලින් ලබා දී ඇති උපදෙස් ප්‍රකාරව පමණි. මෙම රෙගුලාසිය උල්ලංඝනය කලහොත් පත්වීම අවලංගු කරනු ලැබේ.

13.5 බඳවා ගන්නා අයදුම්කාරියන් පුහුණුව අවසන් කිරීමෙන් පසු අවුරුදු 05ක අනිවාර්ය සේවා කාලයක් සේවය කල යුතුය. මෙම අනිවාර්ය සේවා කාලය අවසන් වීමට පෙර යම් නිලධරයෙකු තනතුරින් ඉල්ලා අස්වීමට අදහස් කරන්නේ නම්, ඇයගේ පුහුණුව හා නිළ ඇඳුම් ඇතුළු අනෙකුත් වියදම් වෙනුවෙන් නියම කරනු ලබන මුදල් සියල්ල ඉල්ලා අස්වීමේ ලිපිය බාරදෙන අවස්ථාවේදීම ගෙවීමට කැමැත්ත පලකිරීමේ ගිවිසුමකට එළඹිය යුතුය. ඉල්ලා අස්වීම සම්බන්ධයෙන් ආයතන සංග්‍රහය/කාර්යය පටිපාටික රීති සහ රාජ්‍ය සේවා කොමිෂන් සභා විධිවිධානයන්ට යටත්ව කටයුතු කරනු ලැබේ.

13.6 ඉඳුරාම බඳවාගන්නා සෑම නිලධරයෙකුම පොලිස් සේවයට පළමුවෙන් පත්කරනු ලැබූ විට තමා සතු වූ ස්වකීය අයිතියෙන්ම ඇත්තාවූ හෝ නමට ලියා තිබෙන්නාවූ හෝ පවරා තිබෙන්නාවූ හෝ සියලුම වත්කම් පිළිබඳව ද තමා විසින් දරනු ලැබූ සියලුම බැරකම් පිළිබඳවද විස්තර සිය පෞද්ගලික ලිපිගොණුවේ ඇතුලත් කිරීම පිණිස (ප්‍රතිශෝධිත) අංක 261 දරන පොදු ආකෘතිපත්‍රයේ ඇතුලත් කර පොලිස්පති වෙත සැපයිය යුතු ය.

නිලධරයා විවාහ වූ වහාම ඉහත කී විස්තරය කලත්‍රයා සම්බන්ධවද ඇතුලත් කර සැපයිය යුතුය.

ඉහත විස්තර කර ඇති ආකාරයේ අලුත් අයිතිවාසිකමක් හෝ වත්කමක් හෝ අත්කරගනු ලැබුවහොත් එසේ අත්කර ගන්නා ලද අයිතිවාසිකම හෝ වත්කම පිළිබඳ සම්පූර්ණ විස්තර තමාගේ පුද්ගලික ලිපිගොණුවේ ඇතුලත් කිරීම සඳහා සෑම නිලධරයෙකු විසින්ම පොලිස්පති වෙත ලිඛිතව දැන්විය යුතු ය.

13.7 ආධුනික කාන්තා පොලිස් කොස්තාපල් නිලධරයන් ශ්‍රී ලංකා පොලිස් විද්‍යාලයේ පුහුණුව ආරම්භ කල වහාම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුකූලව ක්‍රියා කරන බවට ප්‍රතිඥා දිවුරුම් දිය යුතුය.

14. *පත්වීම ස්ථිර කිරීම* :

ඉඳුරාම බඳවා ගන්නා නිලධාරිනිය වසර 03ක පරිවාස කාලය අවසානයේදී නිලධරයින්ගේ සේවය පත්කිරීම් බලධරයා විසින් ස්ථිර කරනු ලැබේ. පරිවාස කාලය තුලදී පලමුවන කාර්යක්ෂමතා කඩඉම සමත්වීමට අසමත් වුවහොත් නිලධරයාගේ ජ්‍යෙෂ්ඨත්වය ගතවන අමතර කාලය මත කාර්යය පටිපාටික රීති අනුව තීරණය කර සේවය ස්ථිර කරනු ලැබේ.

එසේ වුවද අමතර වසර 03ක කාලය තුළ පලමු වන කාර්යක්ෂමතා කඩඉම සමත්වීමට අපොහොසත්වන නිලධරයන්ගේ පත්වීම ස්ථිර කිරීම හෝ පරිවාස කාලය දීර්ඝ කිරීම සම්බන්ධව පත්කිරීම් බලධාරියා විසින් තීරණය කලහොත් මිස පත්වීම අවසන් කරනු ලැබේ.

15. කාර්යක්ෂමතා කඩඉම :

කාර්යක්ෂමතා කඩඉම ක්‍රියාත්මක කිරීම පහත පරිදි වේ.:

| *කුමන කාර්යක්ෂමතා කඩඉම ද යන වග* | *කාර්යක්ෂමතා කඩඉම සමත්විය යුත්තේ කොපමණ වසර ගණනකට පෙරද* | *කාර්යක්ෂමතා කඩඉමේ ස්වභාවය ලිඛිත පරීක්‍ෂණය/වෘත්තීය පරීක්‍ෂණය/සහතික පාඨමාලාව/වෙනත්* |
|---|---|---|
| 1 වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ (සේවය ස්ථිර කිරීමේ පරීක්ෂණය) | කාන්තා පොලිස් කොස්තාපල් තනතුරට පත්වී වසර 03ක් ගතවීමට පෙර | ලිඛිත, ප්‍රායෝගික හා වාචික |
| 2 වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය | කාන්තා පොලිස් සැරයන් තනතුරට පත්වී වසර 03ක් ගතවීමට පෙර | තනතුරට හැඩගැස්සීමේ පුහුණු පාඨමාලාව සාර්ථකව හදාරා අවසන් කිරීම |
| 3 වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය | කාන්තා පොලිස් මහසැරයන් තනතුරට පත්වී වසර 03ක් ගතවීමට පෙර | තනතුරට හැඩගැස්සීමේ පුහුණු පාඨමාලාව සාර්ථකව හදාරා අවසන් කිරීම |

16. භාෂා ප්‍රවීණතාව :

| භාෂාව | ලබාගත යුතු ප්‍රවීණතාව |
|---|---|
| රාජ්‍ය භාෂාව | රාජ්‍ය භාෂාවක් නොවන භාෂා මාධ්‍යයකින් සේවයට බැඳුණු නිලධාරිනියන් විසින් නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතාව පරිවාස කාලය තුල ලබාගත යුතුය. |
| අනෙක් රාජ්‍ය භාෂාව | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 01/2014 හා ඊට අනුෂාංගික චක්‍රලේඛ අනුව අදාළ මට්ටමේ ප්‍රවීණතාව ලබාගත යුතුය. |

17. (අ) මෙම ගැසට් පත්‍රයේ I කොටස (IIඅ) වැනි ඡේදයේ ආරම්භයේ පළ කරන ලද රාජ්‍ය සේවා තනතුරුවලට පත්කිරීම් සම්බන්ධයෙන් අදාළ වන පොදු කොන්දේසි බලපානු ඇත.

18. අයදුම්කාරියන් පහත දැක්වෙන ලිපි ලේඛනවල පිටපත් ස්වකීය අයදුම්පත්‍රවලට අමුණා එවිය යුතු ය. (මුල් ලිපි ලේඛණ ඉදිරිපත් නොකළ යුතු ය.) :-

(අ) උප්පැන්න සහතිකය,

(ආ) ජාතික හැඳුනුම්පතෙහි ඡායා පිටපතක්

(ඇ) අධ්‍යාපන සුදුසුකම් සනාථ කිරීම සඳහා වූ සහතික,

19. (අ) දැනටමත් රාජ්‍ය සේවයෙහි නියුතුව සිටින අයදුම්කාරියන් ඔවුන්ගේ අයදුම්පත අදාළ ආයතන ප්‍රධානීන් මගින් ඉදිරිපත් කළ යුතු ය. අයදුම්කාරිය තෝරා ගන්නා ලද්දේ නම් ඇය නිදහස් කළ හැකි බවට සහතිකයක් අමුණා එවිය යුතුය.

(ආ) අයදුම්කාරිය විසින් අයදුම්පත අඟල් 11 x 8 ප්‍රමාණයේ කඩදාසිවල ස්වකීය අත් අකුරුවලින්ම සම්පූර්ණ කර අදාළ සහතික පිටපත් සමග ඉහත දෙවන ඡේදයේ දක්වා ඇති ලිපිනයට ලැබෙන සේ එවිය යුතු අතර කුමන හෝ හේතුවක් නිසාවත් එය කිසියම් නිලධාරියකු වෙත පෞද්ගලිකව බාර නොදිය යුතු ය.

20. මෙම නිවේදනයෙහි දක්වා ඇති අවශ්‍යතාවන් සෑම අයුරකින්ම සනාථ නොකරන අයදුම්පත් ප්‍රතික්ෂේප කෙරෙනු ඇත. එබඳු අයදුම්කාරියන්ට ඒ සම්බන්ධයෙන් පිළිතුරු එවනු නොලැබේ.

*සටහන.*— පරීක්ෂණ හා සම්මුඛ පරීක්ෂණවලට කැඳවනු ලබන අයදුම්කාරියන්ට ගමන් වියදම් හෝ අනෙකුත් වියදම් කිසිවක් ශ්‍රී ලංකා පොලීසිය විසින් ගෙවනු නොලැබේ.

සී. ඩී. වික්‍රමරත්න,
පොලිස්පති.

පොලිස් මූලස්ථානය,
කොළඹ 01.

ආදර්ශ අයදුම්පත්‍රය

| කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා<br>2" x 2 1/2" ප්‍රමාණය |
|---|

**ශ්‍රී ලංකා පොලීසිය**

**ආධුනික කාන්තා පොලිස් කොස්තාපල් තනතුර**

01. (අ) සම්පූර්ණ නම :————.
(පැහැදිලි ලොකු අකුරෙන්) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ හැඳුනුම්පතේ සඳහන් කර ඇති පරිදිම විය යුතුය.

(ආ) නම (මුලකුරු සමග) :————.

(ඇ) අයදුම් කරන තනතුර :————.

02. ජාතික හැඳුනුම්පත් අංකය :————.
(ජාතික හැඳුනුම්පතේ ඡායා පිටපතක් අමුණා එවිය යුතුය.)

03. පියාගේ සම්පූර්ණ නම :————.

04. අයදුම්කාරිය උපන් ස්ථානය :————.

උපන් ස්ථානයට අදාළ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය :————. පළාත :————.

05. (අ) වර්තමාන ලිපිනය :————.
(ආ) වර්තමාන ලිපිනයට අදාළ පොලිස් ස්ථානය :————.
(ඇ) ස්ථිර ලිපිනය :————.
(ඈ) ස්ථිර ලිපිනයට අදාළ පොලිස් ස්ථානය :————.
(ඉ) ලිපි හුවමාරු කළයුතු ලිපිනය :————.
(ඊ) ස්ථිර ලිපිනයට අදාළ ග්‍රාම නිලධාරී වසම :————.
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය :————.
(උ) දුරකථන අංකය : නිවස :————. ජංගම :————.
(ඌ) විද්‍යුත් තැපැල් ලිපිනය :————.

06. (අ) ජන වර්ගය :————.
(ආ) ඔබ ශ්‍රී ලංකා පුරවැසියකු වූයේ පරම්පරාවෙන් ද ? *නැතහොත්* ලියාපදිංචි කිරීමෙන් ද ? (ලියාපදිංචි වීමෙන් නම් එම සහතිකයේ පිටපතක් අමුණන්න) :————.

(ඇ) ඔබ පුරවැසියකු වූයේ පරම්පරාවෙන් නම් උපන් ස්ථානය :————.
* අයදුම්කාරිය :————.
* අයදුම්කාරියගේ පියා :————.
* අයදුම්කාරියගේ පිය පාර්ශවයේ මුත්තා :————.
* අයදුම්කාරියගේ පිය පාර්ශ්වයේ මී මුත්තා :————.

07. උපන් දිනය :————. (උප්පැන්න සහතිකයේ ඡායා පිටපතක් ඇමිණිය යුතුයි)
වයස : (*ගැසට්* නිවේදනය අනුව අයදුම්පත් භාරගන්නා අවසන් දිනට)
අවුරුදු :————. මාස :————. දින :————.

08. උස : අඩි :————. අඟල් :————.

පපුව : අඟල් :————.

09. අධ්‍යාපන සුදුසුකම් : (සමත් වී ඇති විභාගයන් සඳහන් කර සහතිකවල පිටපත් අමුණා එවිය යුතුය) :————.

10. විවාහක/අවිවාහක බව :————.

11. (අ) දැනට කරන රැකියාව :————.
(ආ) ඔබ සන්නද්ධ සේවාවක සාමාජිකයෙක් ද ? :————.

12. ඔබ මීට පෙර ශ්‍රී ලංකා පොලීසියේ සේවය කර තිබේද ?
තනතුර සහ නිල අංකය :
එසේ නම් ඔබ තනතුරින් ඉවත් වූ හේතු සඳහන් කරන්න.

13. (*අ*) ඔබ සන්නද්ධ සේවයක සේවය කරන්නේ ද? එසේ නම් අයදුම්පත අදාළ හමුදා ප්‍රධානියාගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතු ය. :———.

(*ආ*) ඔබ සන්නද්ධ සේවාවක සේවය කර ඇත් ද ? එසේ නම් අස්වීමේ දී දෙන සහතිකයේ ඡායා පිටපතක් අමුණන්න :———.

14. (*අ*) ඔබ සන්නද්ධ ස්වේච්ඡා සේවයට අනුයුක්තව සිටින්නේ ද ? එසේ නම් අයදුම්පත හමුදා ප්‍රධානියාගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය. :———.

(*ආ*) ඔබ සන්නද්ධ ස්වේච්ඡා සේවයෙහි අනුයුක්තව සිටියේ ද ? එසේ නම් අස්වීමේ දී දෙන සහතිකයේ ඡායා පිටපතක් අමුණන්න. :———.

15. ඔබ කිසියම් වරදක් සම්බන්ධයෙන් හෝ සැකපිට අත් අඩංගුවට ගෙන තිබේ ද ? එසේම යම් වරදක් සම්බන්ධයෙන් චෝදනා ලැබ හෝ උසාවියට කැඳවනු ලැබ හෝ දඬුවම් ලැබ හෝ ඇත් ද ? (එසේ නම් විස්තර සඳහන් කරන්න) :———.

16. ඔබගේ කිසියම් ඥාතියෙකු යම් වරදක් සම්බන්ධයෙන් හෝ සැකපිට අත් අඩංගුවට ගෙන තිබේ ද ? එසේ නම් කිසියම් වරදක් සම්බන්ධයෙන් චෝදනා ලැබ හෝ උසාවියකට කැඳවනු ලැබ හෝ දඬුවම් ලැබ ඇත් ද ? එසේ නම් විස්තර සඳහන් කරන්න :———.

ඉහත කරුණු මාගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට සත්‍ය හා නිවැරදි ඒවා බවට මින් සහතික කරමි. එසේම ඉහත දැක්වූ තොරතුරු වැරදි හා අසත්‍ය ඒවා බවට හෙළිවුවහොත් මා සේවයට පත්කර ගෙන ඇතත් ඕනෑම අවස්ථාවක දී ශ්‍රී ලංකා පොලීසියේ සේවය වහාම නතර කිරීමට යටත් වන බව දනිමි.

———,
අයදුම්කාරියගේ අත්සන.

දිනය :———.

17. ආයතන ප්‍රධානියාගේ සහතිකය : (අදාළ නම් පමණි)

මෙම අයදුම්පත ඉදිරිපත් කරන .......................... මයා/මිය/මෙනවිය .................... දෙපාර්තමේන්තුවේ/ සංස්ථාවේ/ මණ්ඩලයේ සේවයේ නියුතු අයෙකු බවත් ඇය මෙම තනතුර සඳහා තෝරා ගනු ලැබුවහොත් සේවයෙන් මුදා හැරිය හැකි බවත් ප්‍රකාශ කරමි.

———,
ආයතන ප්‍රධානියාගේ අත්සන
සහ නිල මුද්‍රාව.

තනතුර :———.

දිනය :———.

02-381/2

## ශ්‍රී ලංකා පොලීසිය

### පොලිස් කොස්තාපල් රියදුරු තනතුර

ශ්‍රී ලංකා පොලීසියේ ආධුනික පොලිස් කොස්තාපල් රියදුරු තනතුර සඳහා ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

02. පහත දක්වනු ලබන ආකෘති පත්‍රය අනුව සකස් කරන ලද අයදුම්පත් අධ්‍යක්ෂ, බඳවා ගැනීම්, ආධුනිකයින් බඳවා ගන්නා කොට්ඨාසය, අංක 375, පළමු මහල, ශ්‍රී සම්බුද්ධත්ව ජයන්ති මාවත, කොළඹ 06, යන ලිපිනයට එවිය යුතු ය. අයදුම්පත් බහා එවනු ලබන කවරයේ වම් කෙළවරේ ඉහලින් තමා අයදුම්කරන තනතුර සඳහන් කර එය ලියාපදිංචි තැපෑලෙන් 2021.03.31 වැනි දිනට හෝ ඊට පෙර ඉහත සඳහන් ලිපිනයට ලැබීමට සැලැස්විය යුතු ය. ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් සම්බන්ධයෙන් ක්‍රියා නොකරනු ලබන අතර ශ්‍රී ලංකා පොලීසිය විසින් අයදුම්පත් නිකුත් කරනු නොලැබේ.

03. *වැටුප් ක්‍රමය* : (මාසිකව)

රු. 29,540 - 7 x 300 - 27 x 270 - රු. 41,630.00

මෙම වැටුප් ගණනය කිරීම රා. ප. ච. 03/2016 අනුව සිදුකර ඇත.

තවද මෙම නිලධාරීන් 2013.01.07 වැනි දිනැති පොලිස්පති චක්‍රලේඛ අංක 2416/2013 යටතේ ලබාදී ඇති දීමනාවලට ද හිමිකම් ලබයි. ඉහත සඳහන් වැටුප් පරිමාණයට අමතරව මෙහි පහත සඳහන් දීමනා ඔවුන් වෙත මාසිකව හිමිවනු ඇත.

| | | |
|---|---|---|
| (*අ*) | ජීවන වියදම් දීමනාව | රු. 7,800 0 |
| (*ආ*) | රා.ප.ච.03/2016 අනුව තනතුරට අදළ 40% දීමනාව | රු. 11,816 0 |
| (*ඇ*) | දුෂ්කර දීමනාව | රු. 2,000 0 |
| (ඈ) | අන්තර් දීමනාව | රු. 2,500 0 |
| (*ඉ*) | නිල ඇඳුම් පිරිසිදු කිරීමේ දීමනා | රු. 250 0 |
| (*ඊ*) | සංයුක්ත දීමනා (විශේෂ දීමනා ගෙවනු ලබන ප්‍රදේශ සඳහා උපරිමය) | රු. 10,500 0 |
| (*උ*) | සංයුක්ත දීමනා (විශේෂ දීමනා ගෙවනු නොලබන ප්‍රදේශ සඳහා උපරිමය) | රු. 9,800 0 |

මෙම දීමනා වලට අමතරව -

(*අ*) නොමිලේ ගමන් පහසුකම්,

(*ආ*) නිලධාරින්ට නොමිලේ වෛද්‍ය පහසුකම් (විදේශ රටක දී වුවද ප්‍රතිකාර කිරීමට මුදලින් ආධාර ලබා ගත හැක.)

(*ඇ*) සියලුම නිල ඇඳුම් නොමිලේ සපයනු ලැබේ.

(ඈ) තමාගේ ක්‍රීඩා කෞශල්‍යය හා සහජ හැකියාවන් දියුණු කර ගැනීමේ පහසුකම්.

(ඉ) රාජකාරි සඳහා ගමන් වියදම් ද දුෂ්කර සේවය හා විශිෂ්ට රාජකාරි සඳහා තෑගි වශයෙන් මුදල් ද ප්‍රදානය කරනු ලැබේ.

04. *අවශ්‍ය මූලික සුදුසුකම්* :

4:1 *වයස් සීමාව* :

*ගැසට්* නිවේදනය අනුව අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු 18-28 ත් අතර විය යුතු ය.

4:2 *අධ්‍යාපන සුදුසුකම්* :
අ. පො. ස. (සා. පෙළ) විභාගයෙන් ගණිතය හා මාධ්‍ය භාෂාව ඇතුළුව දෙවරකට නොවැඩි වාර ගණනකදී සම්මාන දෙකක් සහිතව විෂයන් 06 ක් සමත්වීම,

**සටහන 01**: ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ විෂයය වර්ගීකරණය අනුව විෂයය අංක 41, 44 දරන සෞන්දර්යය විෂයය යුගලය එක් විෂයක් ලෙසද අංක 42 සහ 45 දරන සෞන්දර්යය විෂය යුගලය එක් විෂයක් ලෙසද සලකා විභාගයෙන් සමත් විෂයය සංඛ්‍යාව තීරණය කරනු ලැබේ.

**සටහන 02** : අ.පො.ස (සා. පෙළ) විභාගයේ තාක්ෂණ විෂයය ලිඛිත පරීක්ෂණයෙන් අසමත්වීම එම විෂයයේ ප්‍රායෝගික පරීක්ෂණය සමත් වුව ද එම විෂයය අසමත් ලෙස සලකනු ලැබේ.

4:3 වෘත්තීය සුදුසුකම් :

සැහැල්ලු මෝටර් රථ හෝ බර වාහන පැදවීමේ වලංගු රියදුරු බලපත්‍රයක් ලබා තිබීම.

**සටහන 01**: මෝටර් රථ කාර්මික ශිල්පය පිළිබඳ දැනීම හෝ මෝටර් රථ අලුත්වැඩියාව පිළිබඳ පළපුරුද්ද හෝ දිගුකාලීනව රිය පැදවීමේ පළපුරුද්ද වෙනුවෙන් ප්‍රමුඛතාවය දෙනු ලැබේ.

4:4 *කායික සුදුසුකම්* :

- උස අඩි 05 යි. අඟල් 02 යි. (අවම),
- පපුව අඟල් 30 (අවම/හුස්ම නාල්ලා).

4.4.1 සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරේ රාජකාරි ඉටුකිරීමටත් ප්‍රමාණවත් කායික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

4.4.2 *දෘෂ්ටිය පිළිබඳ අවශ්‍යතාවයන්* .— උපැස් යුවලක් හෝ ස්පර්ශ කාච නොමැතිව එක් එක් ඇසෙහි අවම දෘෂ්ටිය 6/12ට අඩු නොවිය යුතු ය. එක් ඇසක දෘෂ්ටිය 6/6 වන විට අනෙක් ඇසෙහි 6/18 ක් විය යුතුය. උපැස් යුවලක් ස්පර්ශ කාච පවිච්චි කරන කවර හෝ අයදුම්කරුවෙකු සුදුස්සෙක් නොවනු ඇත.

4.4.3 පොලිස් සේවයේ ගරුත්වයට නොගැලපෙන හා රාජකාරිවලට බාධා විය හැකි අන්දමේ කෘතිම ශාරීරික වෙනස්කම් කර නොතිබිය යුතුය.

4.5 *වෙනත් සුදුසුකම්* :

4:5:1 ශ්‍රී ලංකා පුරවැසියෙකු විය යුතුය.
4:5:2 අයදුම්කරු අයහපත් චරිතයකින් යුක්ත නොවිය යුතුය.
4:5:3 අයදුම්කරු අවිවාහක විය යුතුය. (දික්කසාද වූවන් සහ වැන්දඹුවන්, මේ සඳහා සුදුසුකම් නොලබයි.)
4.5.4 දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට බැඳී සිටිය යුතුය.
4.5.5 තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය වන 4:1 සහ 4:2 යන සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් දිනට සම්පූර්ණ කර තිබිය යුතු අතර 4:4 හා 4:5 හි සුදුසුකම් බඳවා ගන්නා දිනටද ඒ ආකාරයෙන්ම තිබිය යුතුය.

05. *මූලික පරීක්ෂණය* :

අයදුම්පත් ඉදිරිපත් කර ඇති අයදුම්කරුවන් අතරින් මූලික සුදුසුකම් සහ වයස සපුරා ඇති අයදුම්කරුවන් පමණක් මූලික පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ. එම පරීක්ෂණයේදී ඉහත ඡේද 4:1 හා 4:4 (4:4:2 හා 4:4:3 හැර) සුදුසුකම් පරීක්ෂා කරනු ලැබේ.

මූලික පරීක්ෂණයට පෙනී සිටින අයදුම්කරුවන් පොලිස්පති විසින් පත්කරනු ලබන මණ්ඩලයක් විසින් පවත්වනු ලබන ඔරොත්තු දීමේ පරීක්ෂණයට පෙනී සිටිය යුතුය. අයදුම්කරුවන් විසින් ඔරොත්තු දීමේ පරීක්ෂණයට මුහුණදීමට සුදුසු බවට කැඳවීම් ලිපිය සමග අමුණා එවනු ලබන පෝරමය ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ලියාපදිංචි වෛද්‍යවරයෙකුගේ නිර්දේශය සහිතව එම අවස්ථාවේදී ඉදිරිපත් කල යුතු ය.

මූලික පරීක්ෂණයෙන් සමත් වන සියලු අයදුම්කරුවන් යෝග්‍යතා පරීක්ෂණයට යොමු කරන අතර, එහිදී මීටර් 1000 ක දුරක් විනාඩි 05කට වඩා අඩු කාලයක් තුළදී සම්පූර්ණ කිරීම (දිවීම) යෝග්‍යතා පරීක්ෂණයෙන් සමත් ලෙස සලකනු ලැබේ.

06. වෘත්තියමය පරීක්ෂණය :

මූලික පරීක්ෂණයෙන් සමත් වන අයදුම්කරුවන් වෘත්තිමය පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ. වෘත්තීය පරීක්ෂණය පහත විෂයයන් යටතේ පවත්වනු ලැබේ.

| *විෂයන්* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *සමත් ලකුණු ප්‍රමාණය* |
|---|---|---|
| 01. ලිඛිත | 40 | 20 } 50% |
| 02. ප්‍රායෝගික පරීක්ෂණය | 60 | 30 |

07. *ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය* :

මූලික පරීක්ෂණයෙන් හා වෘත්තීය පරීක්ෂණයෙන් සමත් වන අයදුම්කරුවන් පමණක් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය සඳහා යොමු කරනු ලැබේ. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පොලිස්පති විසින් පත් කරනු ලැබේ.

| *ලකුණු ලබාදෙනු ලබන ප්‍රධාන ශීර්ෂ* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *තෝරාගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය* |
|---|---|---|
| 01. අතිරේක අධ්‍යාපන සුදුසුකම් | 20 | අදාළ නොවේ. |
| 02. කාර්මික දැනුම/භාෂා දැනුම/පරිගණක හැකියාව/වෙනත් | 20 | |
| 03. ක්‍රීඩා කුසලතා | 20 | |
| 04. නායකත්වය/ප්‍රජා සේවාවන් | 20 | |
| 05. සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ ඇගයීම | 20 | |
| එකතුව | 100 | |

08. *බඳවා ගැනීමේ ක්‍රමය* :

වෘත්තීය පරීක්ෂණයෙන් සහ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයෙන් ලබාගන්නා ලකුණු සංඛ්‍යාව එකතු කොට අයදුම්කරුවන් ලබාගත් මුළු ලකුණු සංඛ්‍යාව අවරෝහණ ක්‍රමයට සකස් කරනු ලැබේ. එම ලකුණු අනුපිළිවෙල අනුව පසුබිම් පරීක්ෂණ සහ වෛද්‍ය පරීක්ෂණයන්ට කැඳවා ඉන් සමත්වන අයදුම්කරුවන් පවතින පුරප්පාඩු සංඛ්‍යාව මත තනතුරට බඳවා ගනු ලැබේ.

*සටහන*.- ඉහත පරිපාටීන්ට පරිබාහිරව ජාත්‍යන්තර මට්ටමේ, ජාතික මට්ටමේ හෝ විශිෂ්ට ක්‍රීඩා කෞශල්‍යයකින් යුක්ත වූ හෝ වෙනත් ක්ෂේත්‍රයකින් සුවිශේෂි දක්ෂතා හෝ ප්‍රවීණතා පෙන්නුම් කර ඇති අයදුම්කරුවෙකුගේ උස සහ පපුව පිළිබඳ සුදුසුකම් නොසලකා අනෙකුත් සුදුසුකම් සපුරා ඇත්නම් පත්කිරීම් බලධාරියාගේ අභිමතය පරිදි බඳවා ගත හැකිය.

09. *පසුබිම් පරීක්ෂණය* :

9.1 ඉහත ඡේද 08 පරිදි බඳවා ගැනීමට සුදුසුකම් ලබා ඇති අයදුම්කරුවන් සම්බන්ධයෙන් යහපත් චරිතය තහවුරු කර ගැනීම සඳහා පසුබිම් පරීක්ෂණයක් පවත්වනු ලබයි.

9.2 මෙහි දී අයදුම්කරුගේ අයහපත් චරිතය අනාවරණය කරගැනීම සඳහා ඔහු හා ඔහුගේ සමීප ඥාතීන්ද ඔහු සමීපව ඇසුරු කරන්නන්ගේද අයහපත් චරිතය හා හැසිරීම සම්බන්ධව පරීක්ෂණ පවත්වනු ලබන අතර, අයහපත් පසුබිම් වාර්තා සහිත අයදුම්කරුවන් බඳවා ගනු නොලැබේ.

9.3 බඳවා ගැනීමේදී අයදුම්කරුවන් විසින් අසත්‍ය තොරතුරු සැපයීම ඔහු බඳවා ගැනීමට නුසුදුසුකමක් වේ. අසත්‍ය තොරතුරු සැපයූ බව බඳවා ගැනීමෙන් පසුව හෙළිවුවහොත් ඕනෑම අවස්ථාවකදී සේවයෙන් ඉවත් කරනු ලැබේ.

10. *වෛද්‍ය පරීක්ෂණය* :

අයහපත් පසුබිම් වාර්තා නොමැති අයදුම්කරුවන් පමණක් වෛද්‍ය පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ. තෝරාගත් අයදුම්කරුවන් පොලිස් රෝහලේ ප්‍රධාන වෛද්‍ය නිලධාරියා ඇතුළු වෛද්‍ය මණ්ඩලයක් විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයෙන් සමත් විය යුතු ය. මෙහිදී අයදුම්කරුවන් පොලිස් රාජකාරි සඳහා සුදුසු බවට ශාරීරික හා මානසික යෝග්‍යතාව සම්බන්ධයෙන් වෛද්‍ය පරීක්ෂණයකටද යොමු කරනු ලැබේ. වෛද්‍ය පරීක්ෂණයට භාජනය විය හැක්කේ එක් වරක් පමණි. වෛද්‍ය පරීක්ෂණය සෞඛ්‍ය 169 පෝරමයට අදාළව සිදුකරනු ලබයි. වෛද්‍ය මණ්ඩලය ප්‍රතික්ෂේප කරනු ලබන අයදුම්කරුවන්ට අභියාචනා ඉදිරිපත් කල නොහැක.

11. *පුහුණුව* :

11.1 ඉහත පරීක්ෂණ සියල්ලන්ගෙන් සමත් වන අයදුම්කරුවන් පමණක් පවතින පුරප්පාඩු ප්‍රමාණය මත පොලිස්පති විසින් නියම කරනු ලබන දිනකදී පුහුණුව සඳහා කැඳවනු ලැබේ. මූලික පුහුණුව ශ්‍රී ලංකා පොලිස් විද්‍යාලයේ පවත්වන අතර, ඉන්පසුව ආධුනික කාලය අවසන් වන තෙක් අදාළ ක්ෂේත්‍ර පුහුණුව ලබාදීම සිදුකෙරෙයි.

11.2 මූලික පුහුණුව සාර්ථකව අවසන් නොකරන නිලධාරීන්ගේ මූලික පුහුණු කාලය දීර්ඝ කිරීම හෝ අවස්ථානුකූලව පත්වීම අවලංගු කිරීම පත්කිරීම් බලධාරියා විසින් තීරණය කරනු ලැබේ.

12. *තනතුරේ ස්වභාවය* :

ස්ථිරය, විශ්‍රාම වැටුප් සහිතය.

(විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයන්ට යටත් විය යුතුය)

13. *සේවා කොන්දේසි :*

13.1 තෝරාගනු ලබන අයදුම්කරුවන් ඉහත 13.3 වගන්තියට යටත්ව තුන් (03) අවුරුදු ආධුනික කාලපරිච්ඡේදයක් සම්පූර්ණ කල යුතු ය.

13.2 තෝරාගනු ලබන අයදුම්කරුවන් රාජ්‍ය භාෂා ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සඳහා දැනටමත් සම්පාදිතව පවත්නා සහ මින්මතු ඒ සම්බන්ධයෙන් සම්පාදනය කරනු ලබන කිසියම් නියෝග වෙතොත් ඒවාටද අනුකූලව කටයුතු කල යුතුය.

13.3 ජාතික පොලිස් කොමිෂන් සභා නියමයන්, ආයතන සංග්‍රහයේ විධිවිධාන, කාර්යය පටිපාටික රීති, මුදල් රෙගුලාසි, රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ, භාණ්ඩාගාර චක්‍රලේඛ, ශ්‍රී ලංකා පොලිස් නියෝග, පොලිස් *ගැසට්* නිවේදන, පොලිස්පති චක්‍රලේඛ, පොලිස් උපදෙස් සංග්‍රහවල විධිවිධාන සහ පත්වීම් ලිපියේ ඇතුළත් කොන්දේසිවලටද යටත් විය යුතු යි.

13.4 ආධුනික කාලය පත්වීම් දින සිට මුල් වසර 03ක් සඳහා බලපැවැත්වෙන අතර, එම කාලය තුළදී නිලධරයා හට විවාහ වීමට අවසර දෙනු නොලැබේ. විවාහ විය හැක්කේ පොලිස් චක්‍රලේඛවලින් ලබා දී ඇති උපදෙස් ප්‍රකාරව පමණි. මෙම රෙගුලාසිය උල්ලංඝනය කලහොත් පත්වීම අවලංගු කරනු ලැබේ.

13.5 යම් නිලධරයෙකු තනතුරින් ඉල්ලා අස්වීමට අදහස් කරන්නේ නම්, ඉල්ලා අස්වීම සම්බන්ධයෙන් ආයතන සංග්‍රහය/කාර්යය පටිපාටික රීති සහ රාජ්‍ය සේවා කොමිෂන් සභා විධිවිධානයන්ට යටත්ව කටයුතු කරනු ලැබේ.

13.6 ඉඳුරාම බඳවාගන්නා සෑම නිලධරයෙකුම පොලිස් සේවයට පළමුවෙන් පත්කරනු ලැබූ විට තමා සතු වූ ස්වකීය අයිතියෙන්ම ඇත්තාවූ හෝ නමට ලියා තිබෙන්නාවූ හෝ පවරා තිබෙන්නාවූ හෝ සියලුම වත්කම් පිළිබඳව ද තමා විසින් දරනු ලැබූ සියලුම බැරකම් පිළිබඳවද විස්තර සිය පෞද්ගලික ලිපිගොණුවේ ඇතුලත් කිරීම පිණිස (ප්‍රතිශෝධිත) අංක 261 දරන පොදු ආකෘති පත්‍රයේ ඇතුළත් කර පොලිස්පති වෙත සැපයිය යුතු ය.

නිලධරයා විවාහ වූ වහාම ඉහත කී විස්තරය කලත්‍රයා සම්බන්ධවද ඇතුළත් කර සැපයිය යුතුය.

ඉහත විස්තර කර ඇති ආකාරයේ අලුත් අයිතිවාසිකමක් හෝ වත්කමක් හෝ අත්කරගනු ලැබුවහොත් එසේ අත්කර ගන්නා ලද අයිතිවාසිකම හෝ වත්කම පිළිබඳ සම්පූර්ණ විස්තර තමාගේ පුද්ගලික ලිපිගොණුවේ ඇතුළත් කිරීම සඳහා සෑම නිලධරයෙකු විසින්ම පොලිස්පති වෙත ලිඛිතව දැන්විය යුතු ය.

13.7 ආධුනික පොලිස් කොස්තාපල් නිලධරයන් ශ්‍රී ලංකා පොලිස් විද්‍යාලයේ පුහුණුව ආරම්භ කල වහාම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුකූලව ක්‍රියා කරන බවට ප්‍රතිඥා දිවුරුම් දිය යුතුය.

14. *පත්වීම ස්ථිර කිරීම :*

ඉඳුරාම බඳවා ගන්නා නිලධාරීන්ගේ වසර 03ක ආධුනික කාලය අවසානයේදී නිලධරයින්ගේ සේවය පත්කිරීම් බලධරයා විසින් ස්ථිර කරනු ලැබේ. ආධුනික කාලය තුළදී පලමුවන කාර්යක්ෂමතා කඩඉම සමත්වීමට අසමත් වුවහොත් නිලධරයාගේ ජ්‍යෙෂ්ඨත්වය ගතවන අමතර කාලය මත කාර්යය පටිපාටික රීති අනුව තීරණය කර සේවය ස්ථිර කරනු ලැබේ.

එසේ වුවද අමතර වසර 03ක කාලය තුළ පලමු වන කාර්යක්ෂමතා කඩඉම සමත්වීමට අපොහොසත්වන නිලධරයන්ගේ පත්වීම ස්ථිර කිරීම හෝ පරිවාස කාලය දීර්ඝ කිරීම සම්බන්ධව පත්කිරීම් බලධාරියා විසින් තීරණය කලහොත් මිස පත්වීම අවසන් කරනු ලැබේ.

15. *කාර්යක්ෂමතා කඩඉම :*

කාර්යක්ෂමතා කඩඉම ක්‍රියාත්මක කිරීම පහත පරිදි වේ. :

| *කුමන කාර්යක්ෂමතා කඩඉම ද යන වග* | *කාර්යක්ෂමතා කඩඉම සමත් විය යුත්තේ කොපමණ වසර ගණනකට පෙරද* | *කාර්යක්ෂමතා කඩඉමේ ස්වභාවය ලිඛිත පරීක්‍ෂණය/වෘත්තීය පරීක්‍ෂණය/සහතික පාඨමාලාව/වෙනත්* |
|---|---|---|
| 1 වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ (සේවය ස්ථිර කිරීමේ පරීක්ෂණය) | පොලිස් කොස්තාපල් රියැදුරු තනතුරට පත්වී වසර 03ක් ගතවීමට පෙර | ලිඛිත, ප්‍රායෝගික හා වාචික |
| 2 වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය | පොලිස් සැරයන් රියැදුරු තනතුරට පත්වී වසර 03ක් ගතවීමට පෙර | තනතුරට හැඩගැස්සීමේ පුහුණු පාඨමාලාව සාර්ථකව හදාරා අවසන් කිරීම |
| 3 වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය | පොලිස් මහසැරයන් රියැදුරු තනතුරට පත්වී වසර 03ක් ගතවීමට පෙර | තනතුරට හැඩගැස්සීමේ පුහුණු පාඨමාලාව සාර්ථකව හදාරා අවසන් කිරීම |

| *කුමන කාර්යක්ෂමතා කඩඉම ද යන වග* | *කාර්යක්ෂමතා කඩඉම සමත් විය යුත්තේ කොපමණ වසර ගණනකට පෙරද* | *කාර්යක්ෂමතා කඩඉමේ ස්වභාවය ලිඛිත පරීක්ෂණය/වෘත්තීය පරීක්ෂණය/සහතික පාඨමාලාව/වෙනත්* |
|---|---|---|
| 4 වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය | උප පොලිස් පරීක්ෂක (ප්‍රවාහන) තනතුරට පත්වී වසර 03ක් ගතවීමට පෙර | තනතුරට හැඩගැස්සීමේ පුහුණු පාඨමාලාව සාර්ථකව හදරා අවසන් කිරීම |

16. *භාෂා ප්‍රවීණතාව :*

| *භාෂාව* | *ලබාගත යුතු ප්‍රවීණතාව* |
|---|---|
| රාජ්‍ය භාෂාව | ඉංග්‍රීසි භාෂා මාධ්‍යයෙන් සේවයට බැඳුණු නිලධාරීන් විසින් නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතාව රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 01/2014 හා ඊට අනුෂාංගික චක්‍රලේඛ අනුව අදාළ මට්ටමේ ප්‍රවීණතාව ලබාගත යුතුය. |
| අනෙක් රාජ්‍ය භාෂාව | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 01/2014 හා ඊට අනුෂාංගික චක්‍රලේඛ අනුව අදාළ මට්ටමේ ප්‍රවීණතාව ලබාගත යුතුය. |

17. (අ) මෙම *ගැසට් පත්‍රයේ* I කොටස (IIඅ) වැනි ඡේදයේ ආරම්භයේ පළ කරන ලද රාජ්‍ය සේවා තනතුරුවලට පත්කිරීම් සම්බන්ධයෙන් අදාළ වන පොදු කොන්දේසි බලපානු ඇත.

18. අයදුම්කරුවන් පහත දැක්වෙන ලිපි ලේඛනවල පිටපත් ස්වකීය අයදුම්පත්‍රවලට අමුණා එවිය යුතු ය. (මුල් ලිපි ලේඛන ඉදිරිපත් නොකළ යුතු ය.) :-

(අ) උප්පැන්න සහතිකය,

(ආ) ජාතික හැඳුනුම්පතෙහි ඡායා පිටපතක්,

(ඇ) අධ්‍යාපන සුදුසුකම් සනාථ කිරීම සඳහා වූ සහතික,

19. (අ) දැනටමත් රාජ්‍ය සේවයෙහි නියුතුව සිටින අයදුම්කරුවන් ඔවුන්ගේ අයදුම්පත අදාළ ආයතන ප්‍රධානීන් මගින් ඉදිරිපත් කළ යුතු ය. අයදුම්කරු තෝරාගන්නා ලද්දේ නම් ඔහු නිදහස් කළ හැකි බවට සහතිකයක් අමුණා එවිය යුතුය.

(ආ) අයදුම්කරු විසින් අයදුම්පත අඟල් 11 x 8 ප්‍රමාණයේ කඩදාසිවල ස්වකීය අත් අකුරුවලින්ම සම්පූර්ණ කර අදාළ සහතික පිටපත් සමග ඉහත දෙවැනි ඡේදයේ දක්වා ඇති ලිපිනයට ලැබෙන සේ එවිය යුතු අතර කුමන හෝ හේතුවක් නිසාවත් එය කිසියම් නිලධාරියකු වෙත පෞද්ගලිකව බාර නොදිය යුතු ය.

20. මෙම නිවේදනයෙහි දක්වා ඇති අවශ්‍යතාවන් සෑම අයුරකින්ම සනාථ නොකරන අයදුම්පත් ප්‍රතික්ෂේප කෙරෙනු ඇත. එබඳු අයදුම්කරුවන්ට ඒ සම්බන්ධයෙන් පිළිතුරු එවනු නොලැබේ.

*සටහන.*— පරීක්ෂණ හා සම්මුඛ පරීක්ෂණවලට කැඳවනු ලබන අයදුම්කරුවන්ට ගමන් වියදම් හෝ අනෙකුත් වියදම් කිසිවක් ශ්‍රී ලංකා පොලීසිය විසින් ගෙවනු නොලැබේ.

සී. ඩී. වික්‍රමරත්න,
පොලිස්පති.

පොලිස් මූලස්ථානය,
කොළඹ 01.

**ආදර්ශ අයදුම්පත්‍රය**

කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා
2'' x 2 1/2'' ප්‍රමාණය

**ශ්‍රී ලංකා පොලීසිය**

ආධුනික පොලිස් කොස්තාපල් රියැදුරු තනතුර

01. (අ) සම්පූර්ණ නම :————.
(පැහැදිලි ලොකු අකුරෙන්) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ හැඳුනුම්පතේ සඳහන් කර ඇති පරිදිම විය යුතුය.

(ආ) නම (මුලකුරු සමග) :————.

(ඇ) අයදුම් කරන තනතුර :————.

02. ජාතික හැඳුනුම්පත් අංකය :————.
(ජාතික හැඳුනුම්පතේ ඡායා පිටපතක් අමුණා එවිය යුතුය.)

03. පියාගේ සම්පූර්ණ නම :————.

04. අයදුම්කරු උපන් ස්ථානය :————.

උපන් ස්ථානයට අදාළ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය :————. පළාත :————.

05. (අ) වර්තමාන ලිපිනය :————.
(ආ) වර්තමාන ලිපිනයට අදාළ පොලිස් ස්ථානය :————.
(ඇ) ස්ථිර ලිපිනය :————.
(ඈ) ස්ථිර ලිපිනයට අදාළ පොලිස් ස්ථානය :————.
(ඉ) ලිපි හුවමාරු කළයුතු ලිපිනය :————.

(ඊ) ස්ථිර ලිපිනයට අදාළ ග්‍රාම නිලධාරි වසම :———.
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය :———.
(උ) දුරකථන අංකය : නිවස :———. ජංගම :———.
(ඌ) විද්‍යුත් තැපැල් ලිපිනය :———.

06. (අ) ජන වර්ගය :———.

(ආ) ඔබ ශ්‍රී ලංකා පුරවැසියකු වූයේ පරම්පරාවෙන් ද ? *නැතහොත්* ලියාපදිංචි කිරීමෙන් ද ? (ලියාපදිංචි වීමෙන් නම් එම සහතිකයේ පිටපතක් අමුණන්න) :———.

(ඇ) ඔබ පුරවැසියකු වූයේ පරම්පරාවෙන් නම් උපන් ස්ථානය :———.

* අයදුම්කරු :———.
* අයදුම්කරුගේ පියා :———.
* අයදුම්කරුගේ පිය පාර්ශ්වයේ මුත්තා :———.
* අයදුම්කරුගේ පිය පාර්ශ්වයේ මී මුත්තා :———.

07. උපන් දිනය :———. (උප්පැන්න සහතිකයේ ඡායා පිටපතක් ඇමිණිය යුතුයි)
වයස : (*ගැසට්* නිවේදනය අනුව අයදුම්පත් භාරගන්නා අවසන් දිනට)
අවුරුදු :———. මාස :———. දින :———.

08. උස : අඩි :———. අඟල් :———.

පපුව : අඟල් :———.

09. අධ්‍යාපන සුදුසුකම් : (සමත් වී ඇති විභාගයන් සඳහන් කර සහතිකවල පිටපත් අමුණා එවිය යුතුය) :———.

10. විවාහක/අවිවාහක බව :———.

11. (අ) දැනට කරන රැකියාව :———.

(ආ) ඔබ සන්නද්ධ සේවාවක සාමාජිකයෙක් ද ? :———.

12. ඔබ මීට පෙර ශ්‍රී ලංකා පොලීසියේ සේවය කර තිබේ ද ?
තනතුර සහ නිල අංකය :———.
එසේ නම් ඔබ තනතුරින් ඉවත් වූ හේතු සඳහන් කරන්න.

13. (අ) ඔබ සන්නද්ධ සේවයක සේවය කරන්නේ ද? එසේ නම් අයදුම්පත අදාළ හමුදා ප්‍රධානියාගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය. :———.

(ආ) ඔබ සන්නද්ධ සේවාවක සේවය කර ඇත් ද ? එසේ නම් අස්වීමේ දී දෙන සහතිකයේ ඡායා පිටපතක් අමුණන්න :———.

14. (අ) ඔබ සන්නද්ධ ස්වේච්ඡා සේවයට අනුයුක්තව සිටින්නේ ද ? එසේ නම් අයදුම්පත හමුදා ප්‍රධානියාගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය. :———.

(ආ) ඔබ සන්නද්ධ ස්වේච්ඡා සේවයෙහි අනුයුක්තව සිටියේ ද ? එසේ නම් අස්වීමේ දී දෙන සහතිකයේ ඡායා පිටපතක් අමුණන්න. :———.

15. ඔබ කිසියම් වරදක් සම්බන්ධයෙන් හෝ සැකපිට අත් අඩංගුවට ගෙන තිබේ ද ? එසේම යම් වරදක් සම්බන්ධයෙන් චෝදනා ලැබ හෝ උසාවියට කැඳවනු ලැබ හෝ දඬුවම් ලැබ හෝ ඇත් ද ? (එසේ නම් විස්තර සඳහන් කරන්න) :———.

16. ඔබගේ කිසියම් ඥාතියකු යම් වරදක් සම්බන්ධයෙන් හෝ සැකපිට අත් අඩංගුවට ගෙන තිබේ ද ? එසේ නම් කිසියම් වරදක් සම්බන්ධයෙන් චෝදනා ලැබ හෝ උසාවියකට කැඳවනු ලැබ හෝ දඬුවම් ලැබ ඇත්ද ? එසේ නම් විස්තර සඳහන් කරන්න :———.

ඉහත කරුණු මාගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට සත්‍ය හා නිවැරදි ඒවා බවට මින් සහතික කරමි. එසේම ඉහත දැක්වූ තොරතුරු වැරදි හා අසත්‍ය ඒවා බවට හෙළිවුවහොත් මා සේවයට පත්කර ගෙන ඇතත් ඕනෑම අවස්ථාවක දී ශ්‍රී ලංකා පොලීසියේ සේවය වහාම නතර කිරීමට යටත් වන බව දනිමි.

———,
අයදුම්කරුගේ අත්සන.

දිනය :———.

17. ආයතන ප්‍රධානියාගේ සහතිකය : (අදාළ නම් පමණි)

මෙම අයදුම්පත ඉදිරිපත් කරන .......................... මයා ..................... දෙපාර්තමේන්තුවේ/ සංස්ථාවේ/ මණ්ඩලයේ සේවයේ නියුතු අයකු බවත් ඔහු මෙම තනතුර සඳහා තෝරා ගනු ලැබුවහොත් සේවයෙන් මුදා හැරිය හැකි බවත් ප්‍රකාශ කරමි.

———,
ආයතන ප්‍රධානියාගේ අත්සන
සහ නිල මුද්‍රාව.

තනතුර :———.

දිනය :———.

02-381/3

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

### සිංහල මාධ්‍ය උප්පැන්න, මරණ හා විවාහ/අතිරේක විවාහ (උඩරට/සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් තනතුරු - මාතලේ දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවල ඇති උප්පැන්න, මරණ හා විවාහ/අතිරේක විවාහ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

01. අයදුම්කරුවන් අදාළ උප්පැන්න, මරණ හා විවාහ/අතිරේක විවාහ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සැහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැලකිල්ල ලබන මනා පෞරුෂයකින් යුත් අය විය යුතු ය.

02. මෙම තනතුර සඳහා ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයටම ඉල්ලුම් කළ හැකි ය.

03. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට, අයදුම්කරුවන්ගේ වයස අවුරුදු 30 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 50 ට නොවැඩි විය යුතු ය. (විශ්‍රාම ගැන්වීමේ උපරිම වයස අවුරුදු 65 වේ.)

04. විවාහ රෙජිස්ට්‍රාර් ධුරයක් සඳහා අයදුම්කරන්නන් විවාහක අය විය යුතු අතර වැන්දඹු හෝ දික්කසාද නොවිය යුතු ය.

05. කොට්ඨාසයේ ජනතාවගේ භාෂා අවශ්‍යතා අනුව දෙවැනි භාෂාවකින් රාජකාරි කිරීමේ හැකියාව සමග දෙවරකට නොවැඩි වාර ගණනකදී සිංහල භාෂාව සඳහා සම්මාන සාමාර්ථයක් ඇතුළුව අ. පො. ස. (සා. පෙළ) විභාගයෙන් අවම වශයෙන් සම්මාන 03ක් සහිතව විෂයයන් 06කින් සමත්ව සිටිය යුතු ය. *නැතහොත්* ඊට සමාන විභාගයකින් සමත්ව සිටිය යුතු ය.

**සැ. යු.**- අ. පො. ස. (සා. පෙළ) හෝ ඒ සමාන විභාගයක දී එක් විෂයක් කොටස් දෙකකින් සමන්විත අවස්ථාවලදී එය එක් විෂයක් ලෙස සැලකිය යුතු ය. එම විෂය කොටස් දෙකම සමත් නම් පමණක් විෂය සමත් ලෙස සැලකිය යුතු ය.

06. කොට්ඨාසයේ සියලු දෙනාට හෝ වැඩිදෙනෙකුට පහසුවෙන් ළඟා විය හැකි කොට්ඨාසයේ මධ්‍යගත ස්ථානයක පිහිටි තනතුරේ ගෞරවය රැකෙන ආකාරයේ ගොඩනැගිල්ලක කාර්යාලය පිහිටුවීමට හැකියාව තිබිය යුතු ය.

07. අයදුම්පත් කැඳවනු ලබන උප්පැන්න, මරණ හා විවාහ/අතිරේක විවාහ කොට්ඨාසයට ඇතුළත් වන ගම් ලැයිස්තුව/ග්‍රාම නිලධාරි වසම්, අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර පහත උපලේඛනයේ සඳහන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හෝ අදාළ ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල සමෘද්ධි සංවර්ධන සමිති කාර්යාල හා තැපැල් කාර්යාල ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකි ය.

08. මේ සඳහා අවශ්‍ය අයදුම්පත් හා ගම් ලැයිස්තුව/ග්‍රාම නිලධාරි වසම් ඇතුළත් ''ඇමුණුම I'' අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් හෝ අදාළ ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගත හැක. අයදුම්පත් රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවියෙන් ද (www.rgd.gov.lk) ලබාගත හැක.

09. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් 2021 මාර්තු මස 12 වැනි දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතු ය.

කේ. ජී. ධර්මතිලක,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2020 දෙසැම්බර් මස 17 වැනි දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
අංක 234/ඒ 3,
රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

*උපලේඛනය*

| *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර* | *ඉල්ලුම්පත් එවිය යුතු ලිපිනය* |
|---|---|---|---|
| මාතලේ | නාඋල | අඹන්ගග උතුර කොට්ඨාසයේ උප්පැන්න, මරණ හා මාතලේ නැගෙනහිර කොට්ඨාසයේ විවාහ (උඩරට/සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධුරය. | දිස්ත්‍රික් ලේකම්/අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මාතලේ. |

02-292

---

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

## රාජ්‍ය සේවා කොමිෂන් සභාව

### සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ සිංහල විශ්වකෝෂ කාර්යාලයේ සහ සිංහල ශබ්දකෝෂ කාර්යාලයේ සහකාර කර්තෘ තනතුර සඳහා බඳවා ගැනීමේ විවෘත/සීමිත තරග විභාගය - 2021

මෙම විභාගය මගින් බඳවා ගැනීම සිදුකරනුයේ III ශ්‍රේණියේ සහකාර කර්තෘ තනතුර සඳහා වේ.

1. *විභාග දිනය :*

විභාග කොමසාරිස් ජනරාල් විසින් 2021 වර්ෂයේ මැයි මාසයේදී කොළඹ නගරය තුළ පමණක් පිහිටුවනු ලබන විභාග මධ්‍යස්ථානවල දී මෙම විභාගය සිංහල මාධ්‍යයෙන් පමණක් පැවැත්වේ. මෙම විභාගය කල් දැමීමට හෝ අවලංගු කිරීමට හෝ රාජ්‍ය සේවා කොමිෂන් සභාවට බලය ඇත.

2. *මෙම විභාගය මගින් සම්පූර්ණ කිරීමට අපේක්ෂා කරන පුරප්පාඩු ප්‍රමාණය පහත පරිදි වේ.*

විවෘත ධාරාව - 4
සීමිත ධාරාව - 3

3. *බඳවා ගැනීමේ ක්‍රමය :*

- පත්වීම සඳහා තෝරාගනු ලබන්නේ ලිඛිත තරග විභාගයෙන් සෑම විෂයයක් සඳහාම ලකුණු 50%කට නොඅඩුව ලබා ගන්නා අයදුම්කරුවන් අතරින් කුසලතා අනුපිළිවෙළ මත බඳවා ගැනීමට නියමිත සංඛ්‍යාව මෙන් දෙගුණයක් යෝග්‍යතා සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවා පත්වීම සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත්කරනු ලබන පරීක්ෂණ මණ්ඩලයක් මගින් සුදුසුකම් තිබේදැයි පරීක්ෂා කිරීමෙන් අනතුරුව ය.

- පත් කරනු ලබන සංඛ්‍යාව හා පත්වීම ක්‍රියාත්මක වන දිනය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝගය අනුව තීරණය කරනු ලැබේ. කිසියම් පුරප්පාඩු සංඛ්‍යාවක් හෝ පුරප්පාඩු සියල්ල පිරවීමට හෝ රාජ්‍ය සේවා කොමිෂන් සභාවට බලය ඇත. සම ලකුණු ලබාගත් අපේක්ෂකයින් පුරප්පාඩු සංඛ්‍යාව ඉක්මවා සිටින අවස්ථාවක දී එම පුරප්පාඩු සංඛ්‍යාව පිරවීම පිළිබඳ තීරණය කාර්ය පටිපාටික රීති සංග්‍රහයේ 80 වැනි වගන්තිය ප්‍රකාරව, රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ලබා දෙනු ලැබේ.

- විභාග දෙපාර්තමේන්තුව මගින් විභාගය පවත්වනු ලැබේ.

4. *සුදුසුකම් :*

4.1 **විවෘත තරග විභාගය**

(අ) අධ්‍යාපන සුදුසුකම් :

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් අදාළ I හෝ II කාණ්ඩයේ සඳහන් උපාධි විෂයයකින් පළමු පෙළ හෝ දෙවන පෙළ (ඉහළ/පහළ) පන්ති සාමර්ථ්‍යයක් සහිතව විශේෂ උපාධියක් ලබා තිබීම;

හෝ

අදාළ I හෝ II කාණ්ඩයේ සඳහන් උපාධි විෂයයන් දෙකක් ඇතුළුව පන්ති සාමර්ථ්‍යයක් සහිතව සාමාන්‍ය උපාධියක් ලබා තිබීම;

හෝ

අදාළ III, IV කාණ්ඩවල සඳහන් විෂයකින් පළමු පෙළ හෝ දෙවන පෙළ (ඉහළ) පන්ති සාමාර්ථ්‍යයක් සහිතව විශේෂ උපාධියක් ලබා තිබීම;

හෝ

අදාළ III, IV කාණ්ඩවල සඳහන් උපාධි විෂයයකින් දෙකක් ඇතුළුව පන්ති සාමර්ථ්‍යයක් සහිත සාමාන්‍ය උපාධියක් ලබා තිබීම.

| I කාණ්ඩයේ විෂයයන් | II කාණ්ඩයේ විෂයයන් | III කාණ්ඩයේ විෂයයන් | IV කාණ්ඩයේ විෂයයන් |
|---|---|---|---|
| සිංහල | ආර්ථික විද්‍යාව | භෞතික විද්‍යාව | වාණිජ්‍ය හා ගිණුම් |
| ඉංග්‍රීසි | සමාජ විද්‍යාව | රසායන විද්‍යාව | කළමනාකරණය |
| දෙමළ | ඉතිහාසය | උද්භිද විද්‍යාව | ව්‍යාපාර පරිපාලනය |
| පාලි | ජාත්‍යන්තර සබඳතා | සත්ත්ව විද්‍යාව | තොරතුරු තාක්ෂණය |
| සංස්කෘත | භූගෝල විද්‍යාව | ජීව විද්‍යාව | කලා විෂයන් (ඉංග්‍රීසි මාධ්‍ය) |
| වාග් විද්‍යාව | දර්ශනය හා තර්ක ශාස්ත්‍රය | නීතිය | සාහිත්‍ය විචාරය |
| | බෞද්ධ අධ්‍යයනය හා බුද්ධ ධර්මය | | |

(ආ) *කායික සුදුසුකම් :*
සෑම අපේක්ෂකයකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරෙහි රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවෙන් යුක්ත විය යුතුය.

(ඇ) *වෙනත් සුදුසුකම් :*

i. අයදුම්කරුවන් ශ්‍රී ලංකාවේ පුරවැසියන් විය යුතු ය.
ii. අයදුම්කරුවන් විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතු ය.
iii. අයදුම්පත් භාර ගැනීමේ අවසන් දිනට, තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලුම සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

(ඈ) *වයස් සීමාව.-* අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු 21ට නොඅඩු විය යුතු අතර අවුරුදු 35ට නොවැඩි විය යුතුය. ඒ අනුව 2000.03.12 දිනට හෝ ඊට පෙර හා 1986.03.12 දිනට හෝ ඊට පසු උපන් දිනය යෙදී ඇති අයට පමණක් මේ සඳහා අයදුම් කිරීමට සුදුසුකම් ඇත.

4.2 **සීමිත තරග විභාගය :**

(අ) පළපුරුද්ද සඳහා සුදුසුකම් :

ඉහත 4.1 (අ) ඡේදයෙහි දැක්වෙන කවර හෝ සුදුසුකමක් සහිතව අයදුම්පත් භාරගැනීමේ අවසන් දිනට රාජ්‍ය සේවයේ ස්ථිර කර ඇති MN-04 හෝ ඊට ඉහළ වැටුප් කේත සහිතව රාජ්‍ය සේවයේ අවම වශයෙන් වසර 05ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා වැටුප් වර්ධක පහක් (05) උපයාගෙන තිබීම.

(ආ) කායික සුදුසුකම් :
සෑම අපේක්ෂකයකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරෙහි රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවෙන් යුක්ත විය යුතු ය.

(ඇ) වෙනත් සුදුසුකම් :
i. අයදුම්කරුවන් විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතු ය.
ii. අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට පූර්වාසන්නයෙන් වූ වසර 05ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා වැටුප් වර්ධක පහක් (05) උපයාගෙන තිබීම.
iii. මෙම තරග විභාගයට පෙනී සිටීම සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති ලෙස පිළිගනු ලැබීමට අයදුම්කරු සියලු සුදුසුකම් අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

(ඈ) වයස් සීමාව.-අදාළ නොවේ.

- යම් ආගමික නිකායක පැවිදිවරයක් දරන කිසිදු තැනැත්තෙකු මෙම විභාගය සඳහා පෙනී සිටීමට සුදුසුකම් නොලබයි.

5. *සේවා කොන්දේසි :*

5.1 *විවෘත පදනම :*

i. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවලටද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයට ද, රජයේ මුදල් රෙගුලාසිවලටද, තනතුරට අදාළ බඳවා ගැනීමේ නිවේදනය හා එහි සංශෝධිතයන්ට ද, දෙපාර්තමේන්තුගත අනෙකුත් නියෝගවලට ද මෙම පත්වීම යටත් වේ.
ii. මෙම තනතුර ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත ය. ඔබට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයකට ඔබ යටත් විය යුතු වේ. තව ද, ඔබ වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට/වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතුය. රජය මගින් විටින් විට නියම කරනු ලබන ආකාරයට ඔබ විසින් ඒ සඳහා දායක මුදල් ගෙවිය යුතු ය.
iii. මෙම පත්වීම වසර 03ක පරිවාස කාලයකට යටත් ය. බඳවාගෙන වසර 03ක් ඇතුළත බඳවා ගැනීමේ පටිපාටියේ සඳහන් ආකාරයට පළමු වැනි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් විය යුතු ය.
iv. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 01/2014 හි සඳහන් විධිවිධාන හා ඊට අනුශාංගික චක්‍රලේඛවල විධිවිධාන අනුව තනතුරට බැඳී වසර 05ක් ඇතුළත නියමිත රාජ්‍ය භාෂාව පිළිබඳ ප්‍රවීණතාව ලබා ගත යුතුය.
v. තමා වෙත පිරිනමන ලද තනතුරේ රාජකාරි නියමිත දිනයේ දී භාර ගැනීමට අපොහොසත් වන හා/හෝ පත් කරන ලද තනතුරක හෝ පත් කරන ලද ප්‍රදේශයක රාජකාරි භාර ගැනීම ප්‍රතික්ෂේප කරන හෝ මගහරින හෝ අයදුම්කරුවන්ගේ පත්වීම අහෝසිකරනු ලැබීමට රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝග පරිදි බලය ඇත.

5.2 *සීමිත පදනම :*
i. ඉහත 5.1 හි I, IV හා V වගන්තිද මීට අදාළ වේ.
ii. මෙම තනතුර ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත ය. වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට/වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතු ය.
iii. මෙම තනතුරට පත්වීම් ලබන නිලධාරීන් එක් අවුරුදු වැඩ බැලීමේ කාල සීමාවකට යටත් වේ.
බඳවාගෙන වසර 03 ක් ඇතුළත බඳවා ගැනීමේ පටිපාටියේ සඳහන් ආකාරයට පළමු වැනි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් විය යුතුය.

6. *මාසික වැටුප් පරිමාණය :*
මෙම තනතුරට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක : 03/2016 දරන වැටුප් චක්‍රලේඛයට අනුව SL-1-2016 රු. 47,615-10x1,335-8x1,630-17x2,170-රු. 110,895 ක (මාසික) වැටුප් පරිමාණයක් හිමි වේ.

7.

7.1 ලිඛිත විභාගය :

7.1.1 විභාග කොමසාරිස් ජනරාල් මගින් විභාගය පවත්වනු ලැබේ.

7.1.2 විෂය නිර්දේශය :
1. බුද්ධි පරීක්ෂණය
2. සාමාන්‍ය දැනීම
3. භාෂා ශක්‍යතාව සහ අවබෝධය
4. පරිවර්තනය

| ප්‍රශ්න පත්‍ර අංකය | විෂයයන් | ප්‍රශ්න වර්ග/ප්‍රමාණය | කාලය | සමත් ලකුණු ප්‍රමාණය' |
|---|---|---|---|---|
| 1 | බුද්ධි පරීක්ෂණය | බහුවරණ හා කෙටි පිළිතුරු සැපයීමේ මාදිලියේ ප්‍රශ්න 50ක් | පැය 01 | 50% |
| 2 | සාමාන්‍ය දැනීම | බහුවරණ හා කෙටි පිළිතුරු සැපයීමේ මාදිලියේ ප්‍රශ්න 50ක් | පැය 01 | 50% |
| 3 | භාෂා ශක්‍යතාව සහ අවබෝධය | (i) රචනය<br>(ii) අවබෝධය | පැය 03 | 50% |
| 4 | පරිවර්තනය | ඉංග්‍රීසි ඡේදයක් හා සිංහල ඡේදයක් පරිවර්තනය කිරීම | පැය 1 1/2 | 50% |

බුද්ධි පරීක්ෂණය :
පදගත, සංඛ්‍යාත්මක සහ රූපාකර සංදර්භයක් තුළ ඉදිරිපත් කෙරෙන ගැටලු සම්බන්ධයෙන් අයදුම්කරුගේ නිගමනයන් සහ ප්‍රතිචාරයන් පරීක්ෂා කිරීම තුළින් අයදුම්කරුවන්ගේ අවබෝධ කර ගැනීමේ ශක්තිය සහ බුද්ධිය මැනීම මෙයින් අපේක්ෂා කෙරේ.

සාමාන්‍ය දැනීම :
ජාතික කලාපීය සහ ලෝකයේ විවිධ සංවිධාන පරිසරයන් තුළ මෙන්ම අප සමාජය තුළ පවතින සමාජීය, සංස්කෘතික, අධ්‍යාපනික, විද්‍යාත්මක, දේශපාලනමය, ආර්ථික හා අනෙකුත් අදාළ සාධකයන් සම්බන්ධයෙන් අපේක්ෂකයා සතු දැනුවත්භාවය සහ අවබෝධය මැන බැලීම මෙයින් අපේක්ෂා කෙරේ.

භාෂා ශක්‍යතාව හා අවබෝධය :

1. රචනා ලිවීම - දී ඇති මාතෘකාවලින් එකක් තෝරා ගෙන වචන 500කට නොඅඩු රචනයක් ලිවීම.
2. ඡේදයක් ලබා දී ඒ ආශ්‍රයෙන් අසනු ලබන ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම.

පරිවර්තනය

ඉංග්‍රීසි ඡේදයක් ලබා දී එය සිංහලට පරිවර්තනය කිරීම.
සිංහල ඡේදයක් ලබා දී එය ඉංග්‍රීසියට පරිවර්තනය කිරීම.

**සටහන**

(අ) රාජකාරි කටයුතු සඳහා අපේක්ෂකයින්ගේ සුදුසුකම් හා හැකියාව පරීක්ෂා කිරීම පිණිස මෙම ප්‍රශ්න පත්‍ර සකස් කෙරේ.
(ආ) සෑම ලිඛිත පිළිතුරු පත්‍රයක් සම්බන්ධයෙන්ම නොපැහැදිලි අත් අකුරු හා වචනවල අක්ෂර වින්‍යාසය පිළිබඳ වැරදි සම්බන්ධයෙන් ලකුණු අඩු කරනු ලැබේ.
(ඇ) විභාග ප්‍රතිඵල : අයදුම්කරුවන් වෙත විභාග ප්‍රතිඵල දැනුම්දීම විභාග කොමසාරිස් ජනරාල් මගින් තැපෑලෙන් හෝ www. results. exams.gov.lk වෙබ් අඩවිය මගින් සිදුකෙරෙනු ඇත.

7.2 සම්මුඛ පරීක්ෂණය :

7.2.1 ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය

| *ශීර්ෂයන්* | | *උපරිම ලකුණු ප්‍රමාණය* | *සමත් ලකුණු ප්‍රමාණය* |
|---|---|---|---|
| **අතිරේක පළපුරුද්ද**<br>● ග්‍රන්ථකරණය (කර්තෘත්වයෙන් ප්‍රකාශිත භාෂාත්‍රයන් පිළිබඳ, සමාජ විද්‍යාත්මක හා විද්‍යාත්මක ග්‍රන්ථ)<br>(එක් ග්‍රන්ථයකට ලකුණු 05)<br>● විශ්වවිද්‍යාල මට්ටමේ ලා සැලකිය හැකි වාර ප්‍රකාශනයක පළ කර ඇති භාෂාව, සමාජ විද්‍යාත්මක හා විද්‍යාත්මක ක්ෂේත්‍ර පිළිබඳ පර්යේෂණාත්මක ලිපි (එක් ලිපියකට ලකුණු 03)<br>(පුවත්පත් ලිපි සඳහා වන පර්යේෂණාත්මක ලිවීම සලකා බලනු නොලැබේ.) | 60 | 60 | 50% |
| **භාෂා ප්‍රවීණතාව**<br>● පිළිගත් විශ්වවිද්‍යාලයක උපාධි විෂයක් ලෙස උපාධිය ලබා ඇති භාෂා මාධ්‍ය හැර වෙනත් භාෂාවක් හදාරා තිබීම. (ඉංග්‍රීසි, දෙමළ, පාලි, සංස්කෘත ආදී වශයෙන්)<br>(එක් භාෂාවක් සඳහා ලකුණු 10 බැගින් උපරිම 20කි)<br>● රජයේ පිළිගත් ආයතනයක වෙනත් භාෂාවන් පිළිබඳ වසරකට නොඅඩු ඩිප්ලෝමා පාඨමාලාවක් සඳහා (ඉංග්‍රීසි, දෙමළ, පාලි, සංස්කෘත ආදී වශයෙන්)<br>(වසර 01ක් හෝ පැය 1500)<br>(එක් භාෂාවක් සඳහා ලකුණු 07 බැගින්)<br>අ.පො.ස උ/පෙළ විභාගයේ දී වෙනත් භාෂාවක් විෂයක් ලෙස සම්මාන සාමර්ථ්‍ය සහිතව සමත්වීම.<br>(එක් භාෂාවක් සඳහා ලකුණු 05 බැගින්)<br>සටහන :<br>අධ්‍යාපනය හැදෑරූ මාධ්‍ය හැර වෙනත් භාෂා සැලකේ. මේ යටතේ ලකුණු ලබා දෙනුයේ මූලික සුදුසුකම්වලට අමතර සුදුසුකමක් සඳහා පමණි. | 20 | 20 | |
| **තොරතුරු තාක්ෂණය පිළිබඳ දැනුම**<br>● විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගන්නා විශ්ව විද්‍යාලයක උපාධියක් සඳහා තොරතුරු තාක්ෂණය ප්‍රධාන විෂයක් ලෙස හදාරා තිබීම සඳහා<br>● රජයේ පිළිගත් ආයතනයක අවුරුදු 01කට නොඅඩු තොරතුරු තාක්ෂණය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාවක් සඳහා හෝ පැය 1500 සඳහා<br>● රජයේ පිළිගත් ආයතනයක තොරතුරු තාක්ෂණය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාවක් සඳහා හෝ අ.පො.ස. උ/පෙළ විභාගයේ දී තොරතුරු තාක්ෂණය විෂයක් ලෙස හදාරා තිබීම. (මූලික සුදුසුකම්වලට අමතර සුදුසුකම් සඳහා පමණක් ලකුණු ලබාදෙනු ලැබේ.) | 15<br>10<br>05 | 15 | |
| **වෙනත්**<br>(a) නායකත්වය<br>(b) සන්නිවේදන හැකියාව<br>(c) පෞරුෂය | 02<br>02<br>01 | 05 | |

රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත් කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් ලකුණු ලබාදීම කරනු ලබයි.

8. *විභාග කොන්දේසි :*

I. විභාගය සිංහල මාධ්‍යයෙන් පමණක් පැවැත්වේ. සෑම අපේක්ෂකයකුම ප්‍රශ්න පත්‍ර 04ටම පෙනී සිටිය යුතු ය.

II. ඒ අනුව තනතුරට බඳවා ගන්නා මාධ්‍ය සිංහල මාධ්‍ය වේ.

III. විභාග ගාස්තු රු. 1,200 කි. විභාග ගාස්තුව විභාග කොමසාරිස් ජනරාල්ගේ ආදායම් ශීර්ෂ 20-03-02-13ට බැර වන ලෙස දිවයිනේ පිහිටි ඕනෑම තැපැල් කාර්යාලයකට ගෙවා අයදුම්කරුගේ නමින් ම ලබාගන්නා ලදුපතෙහි දරයක් ඉල්ලුම් පත්‍රයේ නියමිත ස්ථානයේ නොගැලවෙන සේ අලවන්න. එම කුවිතාන්සියේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

IV. විභාගය සඳහා ගෙවන ලද මුදල කිසිම හේතුවක් නිසා ආපසු ගෙවනු නොලැබේ.

V. මෙම විභාගය කොළඹ දී පැවැත්වේ. විභාගය පවත්වනු ලබන දිනය පසුව දැනුම් දෙනු ලැබේ.

VI. අසම්පූර්ණ අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.
**සටහන :** ප්‍රවේශ පත්‍රය නොමැතිව විභාග ශාලාවට ඇතුළුවීමට ඉඩදෙනු නොලැබේ. විභාගය ආරම්භ වන දිනයේ විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වන්නේ තම අත්සන සහතික කරවා ගත් ප්‍රවේශ පත්‍රයක් පමණි.
අපේක්ෂකයෙකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකමක් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතුය.

VII. ඉල්ලුම් පත්‍රය සෙ. මී. 22-29 ප්‍රමාණයේ A 4 කඩදාසිවල සකස් කළ යුතු අතර, ශීර්ෂ අංක 1.0 පළමුවන පිටුවට ද, 3.0 තෙක් ශීර්ෂ දෙවන පිටුවටද, ඉතිරිය 3, 4 පිටුවලටද වන ලෙස ගෙන සකස් කර ඊට අදළ තොරතුරු තම අත් අකුරෙන්ම පැහැදිළිව ඇතුළත් කළ යුතු ය. ආදර්ශ ඉල්ලුම් පත්‍රයට අනුකූල නොවන හා අසම්පූර්ණ ඉල්ලුම්පත්‍ර දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. අදළ ඉල්ලුම් පත්‍රයේ පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. තවද සම්පූර්ණ කරනු ලබන ඉල්ලුම් පත්‍රය විභාග නිවේදනයේ සඳහන් ආදර්ශ ඉල්ලුම් පත්‍රයට අනුකූල ද යන්න පිළිබඳව අයදුම්කරු විසින් විමසා බැලිය යුතු බවත්, එසේ නොවුනහොත් ඉල්ලුම් පත්‍රය ප්‍රතික්ෂේප වන බවත් වැඩි දුරටත් දන්වමි. මේ සමග ඇති ආදර්ශ ඉල්ලුම් පත්‍රයට අනුව සකසන්න.

VIII. විභාගය සඳහා වන සම්පූර්ණ කරන ලද ඉල්ලුම් පත්‍රය ලියාපදිංචි තැපෑලෙන් 2021.03.12 වැනි දින හෝ ඊට පෙර හෝ ලැබෙන සේ ''විභාග කොමසාරිස් ජනරාල්, සංවිධාන (ආයතනික සහ විදේශ විභාග) ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, තැ. පෙ.1503, කොළඹ'' යන ලිපිනයට එවිය යුතුය.

ඉල්ලුම් පත්‍රය බහා එවන කවරයේ වමත් පස ඉහළ කෙළවරේ ඉල්ලුම් කරනු ලබන්නේ විවෘත ධාරාව මත නම් ''සිංහල ශබ්දකෝෂ කාර්යාලයේ සහ සිංහල විශ්වකෝෂ කාර්යාලයේ සහකාර කර්තෘ තනතුර සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2021'' ලෙස ද, ඉල්ලුම් කරනු ලබන්නේ සීමිත ධාරාව මත නම් ''සිංහල ශබ්දකෝෂ කාර්යාලයේ සහ සිංහල විශ්ව කෝෂ කාර්යාලයේ සහකාර කර්තෘ තනතුර සඳහා බඳවා ගැනීමේ සීමිත තරග විභාගය - 2021'' යන වචන පැහැදිලි ලෙස ලිවිය යුතුය.

IX. *ගැසට් නිවේදනයේ* සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත නිවේදනයේ සඳහන් වයස් සීමාව තුළ වන, අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර නියමිත විභාග ගාස්තුව ගෙවා ඊට අදළ ලදුපත සමග නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමුකොට ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත. විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පළ කරනු ඇත. නිවේදනය පළවී දින 2 හෝ 3 ගත වූ පසුවත් තම ප්‍රවේශ පත්‍රය නොලද අපේක්ෂකයකු වේ නම්, දැන්වීමේ සඳහන් පරිදි ඒ පිළිබඳව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ සංවිධාන (ආයතනික හා විදේශ විභාග) ශාඛාවෙන් විමසිය යුතු ය. එසේ විමසීමේ දී, අයදුම්කරු තමා ඉල්ලුම්කරන ලද විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ජාතික හැඳුනුම්පත් අංකය හා ලිපිනය නිවැරදිව සඳහන් කළ යුතු ය. අයදුම්කරු කොළඹින් බැහැර පදිංචිකරුවකු නම්, එම විස්තර සමග, ෆැක්ස් මගින් විභාග ප්‍රවේශ පත්‍රයේ පිටපතක් කඩිනමින් ලබා ගැනීමට හැකිවන පරිදි අයදුම්කරුගේ ෆැක්ස් අංකයද සඳහන් කළ ඉල්ලීම් ලිපියක් දැන්වීමේ සඳහන් ෆැක්ස් අංකය වෙත යොමු කර විමසා සිටීම වඩාත් ඵලදායී වනු ඇත. එසේ විමසීමේ දී, විභාග දෙපාර්තමේන්තුව විසින් විමසා සිටින කිසියම් තොරතුරක් සනාථ කිරීම සඳහා තමා ළඟ තබාගත් අයදුම්පතේ පිටපත, විභාග ගාස්තු ගෙවීමෙන් ලද ලදුපතෙහි පිටපත/විභාග ගාස්තු ගෙවීම අදළ නම් ඊට අදළ ලදුපතේ පිටපත හා අයදුම්පත තැපැල් කිරීමේ දී ලියාපදිංචි කළ කුවිතාන්සිය සුදානමින් තබා ගැනීම ද ප්‍රයෝජනවත් වනු ඇත.

X. රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය මත විභාගය කල්දැමීමේ හෝ අවලංගු කිරීමේ බලය විභාග කොමසාරිස් ජනරාල්වරයා සතු වේ.

XI. විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂකයන් යටත් වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත.

XII. විභාග අපේක්ෂක/අපේක්ෂිකාවන් විභාග ශාලාව තුළදී තමන් පෙනී සිටින සෑම විෂයයක් සඳහාම ශාලාධිපති සෑහීමකට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාවය සනාථ කළ යුතු ය. ඒ සඳහා පහත දැක්වෙන කවර ලියවිල්ලක් හෝ භාර ගනු ලැබේ.

i. ජාතික හැඳුනුම්පත
ii. වලංගු විදේශ ගමන් බලපත්‍රය
iii. වලංගු ශ්‍රී ලාංකික රියදුරු බලපත්‍රය

එමෙන්ම විභාග අපේක්ෂකයින් අනන්‍යතාව තහවුරු කර ගත හැකිවන පරිදි මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව විභාග ශාලාවට ඇතුළු විය යුතු ය. එසේ තම අනන්‍යතාව සනාථ කිරීම ප්‍රතික්ෂේප කරන අයදුම්කරුවන් විභාග ශාලාවට ඇතුළත් කර නොගැනේ. තව ද, විභාග ශාලාවට ඇතුළු වූ මොහොතේ සිට විභාගය අවසන් වී ඉන් පිටවන තෙක් විභාග බලධාරීන්ට අයදුම්කරු හඳුනාගත හැකි පරිදි මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව සිටිය යුතු ය.

*සැලකිය යුතු ය* :

(අ) අයදුම්පතට කිසිම ලියවිල්ලක් හෝ එහි පිටපතක් නොඇමිණිය යුතු ය.
(ආ) ඉල්ලූ අවස්ථාවක දී ලියවිලි ඉදිරිපත් කිරීමට අපොහොසත් වන අපේක්ෂකයන්ගේ අයදුම්පත් පිළිබඳ සලකා බලනු නොලැබේ.

රාජ්‍ය සේවයේ/පළාත් රාජ්‍ය සේවයේ, රාජ්‍ය සංස්ථාවල සේවයේ නියුක්ත නිලධාරීන් විසින් තමන්ගේ දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානීන් මාර්ගයෙන් අයදුම්පත් එවිය යුතු ය. විභාගයට පෙනී සිටීමට පෙර සෑම අයදුම්කරුවකුම තම අත්සන සහතික කරවා ගැනීම අනිවාර්ය වේ. ආයතනයකින් විභාගයට පෙනී සිටින අයදුම්කරුවකු ඔහුගේ අත්සන තමා සේවය කරන ආයතනයේ ප්‍රධානියා ලවා සහතික කරවා ගත යුතු ය.

09. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතී, කලින් කලට රාජ්‍ය සේවය සම්බන්ධයෙන් නිකුත් කර ඇති චක්‍රලේඛ හා විධායක සේවා ගණයේ III ශ්‍රේණියට අදළ වූ බඳවා ගැනීමේ පටිපාටිය හා ඊට සිදුකර ඇති සංශෝධනයන්හි කොන්දේසි මෙම තනතුර සඳහා අදළ වේ.

10. සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් නොගැලපීමක් හෝ අනනුකූලතාවක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක සිංහල මාධ්‍ය නිවේදනයට අනුව කටයුතු කරනු ලැබේ.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

ලේකම්,
බුද්ධ ශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය.

2021 පෙබරවාරි මස 12 වැනි දින.

ආදර්ශ අයදුම්පත්‍ර

**සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ සිංහල විශ්වකෝෂ කාර්යාලයේ සහ සිංහල ශබ්දකෝෂ කාර්යාලයේ සහකාර කර්තෘ තනතුර සඳහා බඳවා ගැනීමේ විවෘත/සීමිත තරග විභාගය - 2021**

Open/Limited Competitive Examination for Recruitment to the Post of Assistant Editor of the Sinhala Encyclopedia Office and the Sinhala Dictionary Office of the Department of Cultural Affairs - 2021

(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා පමණයි)

(අදාළ අංකය කොටුව තුළ ලියන්න . විවෘත - 1/සීමිත - 2)

1.0 පෞද්ගලික තොරතුරු :

I. සම්පූර්ණ නම :..................................................................
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) ..................................................................

II. මුලකුරු අගට යොදා :..................................................................
මුලකුරු සමඟ නම ..................................................................
(ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :..................................................................

III. සම්පූර්ණ නම (මයා/මිය/මෙය) :..................................................................
(සිංහලෙන්/දෙමළෙන්) ..................................................................

IV. ස්ථිර ලිපිනය :..................................................................
(සිංහලෙන්/දෙමළෙන්) ..................................................................

V. ප්‍රවේශ පත්‍ර එවිය යුතු ලිපිනය :..................................................................
(ඉංග්‍රීසි කැපිටල් අකුරින්) ..................................................................

VI. ස්ත්‍රී/පුරුෂ භාවය :
පුරුෂ 0
ස්ත්‍රී 1
(අදළ කොටුව තුළ ලියන්න)

VII. විවාහක/අවිවාහක බව
විවාහක 0
අවිවාහක 1

(අදාළ කොටුව තුළ ලියන්න)

VIII. උපන් දිනය : වර්ෂය ☐☐☐☐ මාසය ☐☐ දිනය ☐☐

IX. 2021.03.12 දිනට වයස : අවුරුදු ☐☐ ☐☐ ☐☐

X. ජාතික හැඳුනුම්පත් අංකය : ☐☐☐☐☐☐☐☐☐☐☐☐

XI. ජන වර්ගය ඃ අදාළ කොටුව තුළ ලියන්න ☐

(සිංහල 1, දෙමළ 2, ඉන්දියානු දෙමළ 3, මුස්ලිම් 4, වෙනත් 5)

XII. ජංගම දුරකථන අංකය ☐☐☐☐☐☐☐☐☐☐

2.0 i. උපාධිය ලද දිනය :————.
ii. විශ්වවිද්‍යාලය/ආයතනය :————.
iii. ලියාපදිංචි වූ අංකය :————.
iv. බාහිර/අභ්‍යන්තර :————.
v. උපාධිය :————.
vi. විෂයන් :————.
vii. පන්තිය :————.
viii. ඉහළ/පහළ :————.
ix. විභාග අංකය :————.
x. විභාගයට පෙනී සිටි භාෂා මාධ්‍ය :————.

3.0 (අ) මුදල් කුවිතාන්සිය මනා ලෙස අලවන්න. ඃ

| ලදුපත නොගැලවෙන සේ එහි එක් දාරයකින් මෙහි අලවන්න.<br>(ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.) |
|---|

(ආ) විභාග අපේක්ෂකත්වය සඳහා සුදුසුකම් ලබා දෙන සේවා/ශ්‍රේණි (පන්තියක්, ශ්‍රේණියක් හෝ බණ්ඩයක් ඇත්නම් සඳහන් කළ යුතු ය.)

දැනට දරන තනතුර :..................................
එම තනතුර මධ්‍යම රජයේ ද, පළාත් රාජ්‍ය සේවයේ ද යන්න :..................................
ශ්‍රේණිය :.......................... පන්තිය/බණ්ඩය ........................
තනතුරට පත්වූ දිනය : ..................................
ස්ථිර කළ දිනය : ..................................
වැටුප් කේත අංකය හා වැටුප් පරිමාණය :..........................................

අයදුම් කිරීම සඳහා සුදුසුකම් ලැබීමට සේවා කාලයන් කිහිපයක් අදාළ නම් එම සක්‍රීය හා සතුටුදායක සේවා කාලයන් පිළිබඳ විස්තර පහත වගුවේ සඳහන් කළ යුතු ය. :

| | *සේවය/ශ්‍රේණිය* | *අදාළ රා.පරි. චක්‍ර. පරිදි වැටුප් කේත අංකය (MN 4-2016)* | *පත් වූ දිනය* |
|---|---|---|---|
| 01. | ........................... | ........................... | ........................... |
| 02. | ........................... | ........................... | ........................... |
| 03. | ........................... | ........................... | ........................... |

*විවෘත පදනම මත අයදුම් කරන නිලධාරීන් සඳහා පමණක් අදාළ වේ.*

4.0 *අයදුම්කරුගේ සහතිකය ඃ*
මෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීම හා විශ්වාසය පරිදි සත්‍ය බවත්, විභාග ගාස්තු ගෙවන ලද අංක .................... හා .................... වැනි දින දරන මුදල් කුවිතාන්සිය මීට අලවා ඇති බවත් ප්‍රකාශ කරමි. තව ද, විභාග නීතිරීතිවලට අනුව ක්‍රියා කිරීමටත්, මෙම විභාගය පිළිබඳ කොන්දේසි අනුව මා නුසුදුස්සකු බව පෙනී ගියහොත්, විභාගයට පෙර හෝ එය පවත්වද්දී හෝ ඉන් පසුව හෝ මගේ විභාග අපේක්ෂකත්වය අවලංගු කිරීමට ගනු ලබන

යම් තීරණයකට මම එකඟ වෙමි. තව ද, විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට මම යටත් වන බව ද ප්‍රකාශ කරමි.

―――――,
අයදුම්කරුගේ අත්සන.

දිනය :―――――.

5.0 අයදුම්කරුගේ අත්සන සහතික කිරීම. :

(අයදුම්පත්‍රයේ අපේක්ෂකයාගේ අත්සන රජයේ විදුහල්පතිවරයෙකු, සමාදාන විනිශ්චයකරුවකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, නීතිඥවරයෙකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරි බලයලත් නිලධාරියෙකු පොලිස් සේවයේ ගැසට් කළ තනතුරක් දරන නිලධාරියෙකු හෝ රජයේ ස්ථිර තනතුරක් දරන මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියෙකු හෝ විසින් සහතික කරනු ලැබිය යුතු ය.)

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන .............................. මයා/මිය/ මෙනවිය මා පෞද්ගලිකව දන්නා හඳුනන බව ද, ඔහු/ඇය මා ඉදිරිපිට දී, ............... දින ඔහුගේ/ඇයගේ අත්සන තැබූ බව ද සහතික කරමි.

―――――,
අත්සන සහතික කරන නිලධාරියාගේ අත්සන.

දිනය :―――――.

සම්පූර්ණ නම :―――――.
තනතුර :―――――.
ලිපිනය :―――――.
දිනය :―――――.
(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න)

*දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය : (සේවයේ නියුතු නම්)*

ඉහත විස්තර සඳහන් .............................. මහතා/මහත්මිය/මෙනවිය මෙම ආයතනයේ සේවය කරන බවත් ඔහු/ඇය විසින් සපයා ඇති තොරතුරු නිවැරදි බවත්, වැඩ හා පැමිණීම සතුටුදායක බවත්, ඔහුට/ඇයට විරුද්ධව කිසිදු චෝදනාවක් නොවන බවත්, මෙම තනතුර සඳහා තෝරාගනු ලැබුවහොත් මෙම ආයතනයේ සේවයෙන් නිදහස් කළ හැකි බවත් සහතික කරමි.

―――――,
දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ අත්සන.

නම :―――――.
පදවි නාමය :―――――.
ලිපිනය :―――――.
දිනය :―――――.
(නිල මුද්‍රාව තබන්න)

***සීමිත පදනම මත අයදුම් කරන නිලධාරීන් හට පමණක් අදාළ වේ.***

6.0 අයදුම්කරුගේ සහතිකය :

2021.03.12 දිනට පූර්වාසන්නයේ වූ පස් අවුරුද්ද තුළ (සේවා හෝ දෙපාර්තමේන්තුමය පරීක්ෂණ සමත්වීම කොන්දේසියක් වන වේතනාධිකය හැර) වේතනාධික සියල්ල මා විසින් උපයාගෙන ඇති බවත්, *ගැසට්* නිවේදනයේ 4.2 (අ) ඡේදයට අනුව 2021.03.12 දිනට සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සහිත බවත් (අවවාද කිරීම් හැර) මොනම ආකාරයක හෝ විනයානුකූල දඬුවමකට මා භාජනය වී නොමැති බවත්, ප්‍රකාශ කරමි. තව ද, විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාග පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම

සම්බන්ධයෙන් ගනු ලබන තීරණවලට මම යටත් වන බව ද ප්‍රකාශ කරමි.

*ගැසට්* නිවේදනයේ සඳහන් සියලුම නීති රෙගුලාසි ප්‍රකාරව සීමිත තරග විභාගයට පෙනී සිටීමට මා සුදුස්සකු බවත්, මෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසය පරිදි සත්‍ය බවත්, විභාග ගාස්තු ගෙවන ලද අංක ......... හා වැනි ............... දින දරන මුදල් කුවිතාන්සිය මීට අලවා ඇති බවත් ප්‍රකාශ කරමි. තව ද, විභාග නීතිරීතිවලට අනුව ක්‍රියා කිරීමටත්, මෙම විභාගය පිළිබඳ කොන්දේසි අනුව මා නුසුදුස්සකු බව පෙනී ගියහොත්, විභාගයට පෙර හෝ එය පවත්වද්දී හෝ ඉන් පසුව හෝ මගේ විභාග අපේක්ෂකත්වය අවලංගු කිරීමට ගනු ලබන යම් තීරණයකට මම එකඟ වෙමි. තව ද, විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට මම යටත්වන බව ද ප්‍රකාශ කරමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

7.0 දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය : (අයදුම්කරුගේ පෞද්ගලික ලිපි ගොනුවට අනුව)

මෙම අයදුම්පත ඉදිරිපත් කරන ............... මහතා/මහත්මිය/මෙනවිය මධ්‍යම රජය යටතේ වන ............ පළාත් සභාව යටතේ වන ............ අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ ............... තනතුරක සේවය කරන බව ද, 2021.03.12 දිනට පූර්වයෙන් පස් අවුරුදු කාල සීමාව තුළ (සේවා හෝ දෙපාර්තමේන්තුමය පරීක්ෂණ සමත්වීමේ කොන්දේසියක් වන වේතනාධිකය හැර) ඔහුගේ/ඇයගේ වේතනාධික සියල්ල උපයාගෙන ඇති බව ද, එම කාල සීමාව තුළ කළ වරදකට (අවවාද කිරීම් හැර) කිසිම ආකාරයක විනයානුකූල දඬුවමකට ඔහු/ඇය භාජනය නොවූ බව ද, *ගැසට්* නිවේදනයෙහි 4.2 (අ) ඡේදයට අනුව අවුරුදු ......... (පහක) සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සහිත බව ද, අදාළ *ගැසට්* නිවේදනයෙහි සඳහන් රෙගුලාසි ප්‍රකාරව ඔහු/ඇය විභාගයට පෙනී සිටීමට සුදුසුකම් ලබා ඇති බව ද, නියමිත විභාග ගාස්තුව ගෙවා ඇති බව ද, එම ලදුපත අලවා ඇති බව ද, ඔහු/ඇය මා ඉදිරිපිට දී මෙම අයදුම්පත අත්සන් කළ බව ද, මෙයින් සහතික කරමි.

————,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ/බලයලත් නිලධාරියාගේ අත්සන.

නම :————.
පදවි නාමය :————.
දිනය :————.
(නිල මුද්‍රාව තබන්න)

02-338

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.